# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

අංක 14,939 — 1970 දෙසැම්බර් 31 වැනි බ්‍රහස්පතින්දා — 1970.12.31

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡේදය—සාමාන්‍ය

(මෙහි වෙනම ගොනුකර ගතහැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් භාගවලට වෙන වෙනම පිටු අංක යොදා ඇත.)

| | පිට |
|---|---|
| අග්‍රාණ්ඩුකාරතුමාණන් විසින් කරන ලද ප්‍රකාශන ආදිය | — |
| අග්‍රාණ්ඩුකාරතුමාණන් කරන පත් කිරීම් ආදිය | 975 |
| රාජ්‍ය සේවා කොමිෂන් සභාවෙන් කරන පත් කිරීම් ආදිය | — |
| අධිකරණ සේවා කොමිෂන් සභාවෙන් කරන පත් කිරීම් ආදිය | — |
| වෙනත් පත් කිරීම් ආදිය | 975 |
| රෙජිස්ට්‍රාර්වරුන්ගේ පත් කිරීම් ආදිය | — |
| ආණ්ඩුවේ නිවේදන | 976 |
| මිළ පාලන දැන්වීම් | — |
| ශ්‍රී ලංකා මහ බැංකුවේ දැන්වීම් | — |
| ආදයම් හා වියදම් පිළිබඳ වාර්තා | — |
| ආණ්ඩුවේ වත්කම් හා බැරකම් ප්‍රකාශය | — |
| විවිධ දෙපාර්තමේන්තු දැන්වීම් | 984 |
| "සුරාබද්ද ආඥාපනත" පිළිබඳ දැන්වීම් | 986 |

## අග්‍රාණ්ඩුකාරතුමාණන් කරන පත් කිරීම් ආදිය

**1970 අංක 421**

අංකය: ඕඑච්/වීඑජ්/17/ඒ (VI)

### යුද්ධ හමුදාව—ලංකා ස්වෙච්ඡා බලසේනාව—අග්‍රාණ්ඩුකාර උතුමාණන් වහන්සේ විසින් පිළිගන්නා ලද අධිකාරියෙන් ඉල්ලා අස්වීමක්

1971 ජනවාරි මස 1 වන දින සිට, යුද්ධ හමුදාවේ, ලංකා ස්වෙච්ඡා බලසේනාවේ පහත නම සඳහන් නිලධාරියාගේ අධිකාරියෙන් ඉල්ලා අස්වීම අග්‍රාණ්ඩුකාර උතුමාණන් වහන්සේ විසින් පිළිගන්නා ලදී :—

ලුතිනන් කෝරලේ ආච්චිල්ලාගේ ගුණපාල අමරසේකර, ලශිබ.

උතුමාණන් වහන්සේගේ අණපරිදි,

ඒ. ආර්. රත්නවේල්,
රාජ්‍ය ආරක්ෂක හා විදේශ කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්.

1970 දෙසැම්බර් මස 17 දින,
කොළඹදීය.

12-1094

## වෙනත් පත්කිරීම් ආදිය

**1970 අංක 422**

පා /සාවි 16/121., පා 4/සාවි 14/155., පා 4/සාවි 14/154., පා 4/සාවි 2/408., පා 4/සාවි 28/177., පා 4/සාවි 4/21., පා 4/සාවි 4/20., පා 4/සාවි 4/50., පා 4/සාවි 4/44., පා 4/සාවි 6/55., පා 4/සාවි 7/63.

### අධිකරණ ආඥාපනත

**82 වන වගන්තිය යටතේ දැන්වීම**

(6 වන අධිකාරය වූ) අධිකරණ ආඥාපනතෙහි 82 වන වගන්තිය යටතේ මා වෙත පැවරුණු බලතල ප්‍රකාර, අධිකරණ ඇමති ජුසේ මරියා ජයමාන්න වන මම,

(1) නීතිඥ ඒ. කේ. වන්දදාස මහතා මාතර අධිකරණ දිස්ත්‍රික්කය සඳහා සාමදාන විනිශ්චයකරුවෙකු සහ නිල නොලත් මහෙස්ත්‍රාත් වරයෙකු වශයෙන් ද,

(2) නීතිඥ ඒ. ආර්. අයි. මරික්කාර් මහතා මාතර අධිකරණ දිස්ත්‍රික්කය සඳහා සාමදාන විනිශ්චයකරුවෙකු සහ නිල නොලත් මහෙස්ත්‍රාත් වරයෙකු වශයෙන් ද,

(3) ප්‍රේමතිලක විජේසේකර මහතා ගාල්ල අධිකරණ දිස්ත්‍රික්කය සඳහා සාමදාන විනිශ්චයකරුවෙකු වශයෙන් ද,

---

**සතිපතා නිකුත්වන ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා එවනු ලබන දැන්වීම් පිළිබඳ**

### විශේෂ නිවේදනයයි

**ඉදිරියට පළවන සාමාන්‍ය සතිපතා ගැසට් පත්‍රවල පළකිරීම සඳහා ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති විසින් දැන්වීම් බාරගන්නා අන්තිම වේලාවන් සහ පළකිරීමේ දින දක්වෙන, මෙම ගැසට් පත්‍රයේ සෑම කොටසකම කෙළවරෙහි පළකර ඇති විශේෂ නිවේදනය කෙරෙහි සියළුදෙනාගේ අවධානය යොමු කෙරේ. යථෝක්ත නිවේදනයේ සඳහන් නියමිත වේලාවන්ට පසුව ලැබෙන සියළු දැන්වීම් ඒවා එවන ලද අය වෙත ආපසු එවනු ලැබේ**

1970 ජූනි 2 වැනි දින,
ලංකාණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව.
කොළඹ.

**එල්. ඩබ්ලිව්. පී. පීරිස්,**
**ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.**

975—බී 69941—10,810 (70/12)

(4) කලෙහෙ පණ්ඩිත කෝරාලලාගේ හරිස්චන්ද්‍ර විජයවික්‍රම මහතා ගාල්ල අධිකරණ දිස්ත්‍රික්කය සඳහා සාමදාන විනිශ්චයකරුවෙකු වශයෙන් ද,

(5) එල්මෝ ස්ටැනිස්ලෝස් ඕවර්ලන්ඩ් මහතා කොළඹ අධිකරණ දිස්ත්‍රික්කය සඳහා සාමදාන විනිශ්චයකරුවෙකු වශයෙන් ද,

(6) හීනක ජස්ටින් සිල්වා මහතා කුරුණෑගල අධිකරණ දිස්ත්‍රික්කය සඳහා සාමදාන විනිශ්චයකරුවෙකු වශයෙන් ද,

(7) අලුත් මුහන්දිරම්ගේ පද්සි අභයවර්ධන මහතා කුරුණෑගල අධිකරණ දිස්ත්‍රික්කය සඳහා සාමදාන විනිශ්චයකරුවෙකු වශයෙන් ද,

(8) නිශ්ශංක ආරච්චිගේ කරුණාසේන මහතා කුරුණෑගල අධිකරණ දිස්ත්‍රික්කය සඳහා සාමදාන විනිශ්චයකරුවෙකු වශයෙන් ද,

(9) ගම්හේවගේ දොන් ලූකස් පියසේන මහතා මීගමුව අධිකරණ දිස්ත්‍රික්කය සඳහා සාමදාන විනිශ්චයකරුවෙකු වශයෙන් ද,

(10) මහමූගේ පීලික්ස් කොස්තා මහතා මීගමුව අධිකරණ දිස්ත්‍රික්කය සඳහා සාමදාන විනිශ්චයකරුවෙකු වශයෙන් ද,

(11) කපුරු පස්ත බණ්ඩාරගේ දොන් හෙක්ටර් පල්ලාවල මහතා මීගමුව අධිකරණ දිස්ත්‍රික්කය සඳහා සාමදාන විනිශ්චයකරුවෙකු වශයෙන් ද,

(12) වලිමුනි දේවගේ හරමානිස් ප්‍රනාන්දු මහතා මීගමුව අධිකරණ දිස්ත්‍රික්කය සඳහා සාමදාන විනිශ්චයකරුවෙකු වශයෙන් ද,

(13) දොන් දියෙස් සූරියආරච්චි මහතා අවිස්සාවේල්ල අධිකරණ දිස්ත්‍රික්කය සඳහා සාමදාන විනිශ්චයකරුවෙකු වශයෙන් ද,

(14) කපුවැල්ලෙ ගම්ලද්දලාගේ ප්‍රඥාරත්න මහතා අවිස්සාවේල්ල අධිකරණ දිස්ත්‍රික්කය සඳහා සාමදාන විනිශ්චයකරුවෙකු වශයෙන් ද,

(15) ඉඳුරුවගේ එලියස් තේස්ව මහතා පානදුර අධිකරණ දිස්ත්‍රික්කය සඳහා සාමදාන විනිශ්චයකරුවෙකු වශයෙන් පත් කරමි.

ජේ. ඇම්. ජයමාන්න,
අධිකරණ ඇමති.

1970 දෙසැම්බර් මස 24 වැනිදා,
කොළඹ, අධිකරණ අමාත්‍යාංශයේ දීය.

12-1223/1

---

**1970 අංක 423**

(20 වෙනි පරිච්ඡේදය වන) ක්‍රිමිනල් නඩු විධාන සංග්‍රහයේ 120 වෙනි වගන්තිය යටතේ ගරු අධිකරණ ඇමතිතුමා විසින්—

අංකය : පා 4/හමප 20/13.

(1) එච්. එම්. පී. සිරිසේන මහතා 1970. 11. 22 වෙනි දින සිට බදුල්ල දිස්ත්‍රික්කයේ ගම්පහ කෝරළයේ හදිසි මරණ පරීක්ෂක වරයෙකු වශයෙන් ද,

අංකය : පා 4/හමප 22/5.

(2) කේ. කාලිමුත්තු මහතා 1971 ජනවාරි මස 1 වැනි දින සිට 1971 මැයි මස 31 වැනි දින දක්වා රත්නපුර දිස්ත්‍රික්කයේ මහජන සෞඛ්‍ය පරීක්ෂක වරයෙකු වශයෙන් කටයුතු කරන කාලය තුළ, රත්නපුර දිස්ත්‍රික්කයේ, කුරුවිට කෝරළයේ තාවකාලික හදිසි මරණ පරීක්ෂක වරයෙකු වශයෙන් ද,

(3) ජේ. ඕ. ජේ. ඔන්ඩච්චි මහතා 1971 ජනවාරි මස 1 වැනි දින සිට 1971 මැයි මස 31 වන දින දක්වා රත්නපුර දිස්ත්‍රික්කයේ මහජන සෞඛ්‍ය පරීක්ෂක වරයෙකු වශයෙන් කටයුතු කරන කාලය තුළ, රත්නපුර දිස්ත්‍රික්කයේ, කුරුවිට කෝරළේ තාවකාලික හදිසි මරණ පරීක්ෂක වරයෙකු වශයෙන් ද,

(4) ආර්. ඩබ්ලිව්. පියසේන මහතා 1970. 12. 12 දින සිට 1971. 5. 9 දින දක්වා, ගිනිගත්හේන, අඹගමුව කෝරළය, ප්‍රාදේශීය ආදායම් නිලධාරි ධුරය දරන කාලය තුළ, හැටන් අධිකරණ කොට්ඨාශය සඳහා තාවකාලික හදිසි මරණ පරීක්ෂක වරයෙකු වශයෙන් ද,

(5) දොස්තර කේ. සේනාතිරාජා මහතා 1970. 12. 12 දින සිට 1971. 5. 9 දින දක්වා, නාවලපිටිය, සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි ධුරය දරණ කාලය තුළ, හැටන් අධිකරණ කොට්ඨාශය සඳහා තාවකාලික හදිසි මරණ පරීක්ෂක වරයෙකු වශයෙන් ද,

(6) ඊ. වේලුපිල්ලේ මහතා 1970. 12. 12 දින සිට 1971. 5. 9 දින දක්වා, මස්කෙළිය, කිත්වයර්, මහජන සෞඛ්‍ය පරීක්ෂක (උත්සව) ධුරය දරණ කාලය තුළ, හැටන් අධිකරණ කොට්ඨාශය සඳහා තාවකාලික හදිසි මරණ පරීක්ෂක වරයෙකු වශයෙන් ද,

(7) වී. ගාමිණී පීරිස් මහතා 1970. 12. 12 දින සිට 1971. 5. 9 දින දක්වා, මස්කෙළිය, බෙල්හවුසිය, මහජන සෞඛ්‍ය පරීක්ෂක (උත්සව) ධුරය දරණ කාලය තුළ, හැටන් අධිකරණ කොට්ඨාශය සඳහා තාවකාලික හදිසි මරණ පරීක්ෂක වරයෙකු වශයෙන් ද,

පත් කරනු ලැබ ඇත්තේ ය.

නිහාල් ජයවික්‍රම,
අධිකරණ අමාත්‍යාංශයේ
ස්ථිර ලේකම්.

1970 දෙසැම්බර් මස 24 වැනිදා,
කොළඹ, අධිකරණ අමාත්‍යාංශයේ දීය.

12-1223/2

---

**1970 අංක 424**

L/44/1

**ඉඩම් සංවර්ධන ආඥපනත (320 වැනි පරිච්ඡේදය)**

ඉඩම් සංවර්ධන ආඥපනතේ 6(1) වැනි ඡෙදය යටතේ කෘෂිකර්ම හා ඉඩම් පිළිබඳ ගරු ඇමති තුමා විසින් පහත නම් සඳහන් ප්‍රාදේශීය ආදායම් නිලධාරීන් ඔවුන්ගේ රාජකාරිවලට අමතරව, ඔවුන්ගේ නම් ඉදිරියෙන් දී ඇති දිස්ත්‍රික්කයන්හි එහි සඳහන් දිනයන්හි සිට ඉඩම් නිලධාරීන් ලෙස පත්කර ඇත.

ආර්. ටී. රත්නතුංග,
අතිරේක ස්ථිර ලේකම්,
කෘෂිකර්ම හා ඉඩම් අමාත්‍යාංශය.

1970.12.8.

| නම | | දිස්ත්‍රික්කය | | දිනය |
|---|---|---|---|---|
| එස්. එම්. චන්ද්‍රසේන | ... | අනුරාධපුරය | ... | 1970. 6. 6 |
| යූ. ඩබ්ලිව් බංඩාර ... | ... | එම | ... | 1970. 6. 9 |
| ඩබ්ලිව් ඒ. වනිගරත්න | ... | එම | ... | 1970. 6.17 |
| ඩබ්ලිව්. තෙන්නකෝන් | ... | එම | ... | 1968. 7. 1 |
| කේ. සිරිසේන ... | ... | එම | ... | 1970. 6. 9 |
| ඒ. එම්. කරුණාරත්න | ... | එම | ... | 1970. 6. 2 |
| ඩබ්ලිව්. කළුපහන ... | ... | එම | ... | 1970. 8. 3 |
| එස්. අබේසිංහ ... | ... | එම | ... | 1970. 6. 9 |
| අයි. ධනපාල ... | ... | රත්නපුර | ... | 1970.10. 2 |
| ඒ. අයි. වික්‍රම ... | ... | එම | ... | 1970. 6. 1 |
| ආර්. ඇම්. ජී. ජයතිලක | ... | බදුල්ල | ... | 1970.10.10 |

12-1141

---

## ආණ්ඩුවේ නිවේදන

### ආගාමික හා විගාමික පනත

**6 වන වගන්තිය යටතේ බලය පැවරීම**

අග්‍රාමාත්‍ය සහ රාජ්‍ය ආරක්ෂක හා විදේශ කටයුතු භාර අමාත්‍ය සිරිමාවෝ රත්වත්තේ ඩයස් බණ්ඩාරනායක වන මම (351 වන අධිකාරය වන) ආගාමික හා විගාමික පනතේ 6 වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, එකී පනතේ 28 වන වගන්තියේ (1) හා (2) වන උපවගන්ති වලින් දෙහෝ ඒ යටතේ හෝ මා වෙත පැවරී, නියමකොට හෝ ප්‍රදානය කොට හෝ තිබෙන බලතල, රාජකාරි සහ කාර්යයන් පාවිච්චි කිරීමට, ඉටු කිරීමට සහ කිරීමට රාජ්‍ය ආරක්ෂක හා විදේශ කටයුතු භාර අමාත්‍යාංශයේ සහකාර ලේකම් කන්දගේ නිව්ටන් සමරසිංහ මහතාට මෙයින් පවරමි.

සිරිමා ආර්. ඩී. බණ්ඩාරනායක,
අග්‍රාමාත්‍ය සහ
රාජ්‍ය ආරක්ෂක හා විදේශ කටයුතු භාර අමාත්‍ය.

1970 දෙසැම්බර් මස 21 දින,
කොළඹ දී ය

12-1095

එල්. ඊ.—බී. 7/63.

## 1963 අංක 4 දරණ දේශීය ආදායම් පනත

### 6අ වගන්තිය යටතේ ආඥාව

1968 අංක 26 දරණ පනතින් සංශෝධනය කරන ලද 1963 අංක 4 දරණ දේශීය ආදායම් පනතේ 6අ වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර මුදල් ඇමති, නානායක්කාර පතිරගේ මාටින් පෙරේරා වන මම, ඉහත කී වගන්තියේ (2) උප වගන්තියේ විධිවිධාන, මෙහි පහත උපලේඛනයේ II තීරුවේ අනුරූප සටහනේ නියමිත දිනයෙහි සිට ක්‍රියාත්මක වන පරිදි, මෙහි පහත උප ලේඛනයේ I තීරුවේ නියමිත පුද්ගලයාට අදාල විය යුතු බව මෙම ආඥාවෙන් ප්‍රකාශ කරමි.

ඇන්. ඇම්. පෙරේරා,
මුදල් ඇමති.

කොළඹ, 1970.12.19.

### උපලේඛනය

| I තීරුව | II තීරුව |
|---|---|
| බස්නාහිර මධ්‍යම සහ දකුණු පළාත් අතර ග්‍රාහක බාහිර ඇමතුම් ලබාගැනීමේ පහසුකම් සැලසීම සහ දැනට තිබෙන විදුලි සංදේශ පහසුකම් පුළුල් කිරීම සඳහා ලංකාණ්ඩුවත් සමග එළඹ ඇති කොන්ත්‍රාත්තුව වෙනුවෙන් ජපානයේ ටෝකියෝවේ සීමාසහිත මිට්සුබූ සහ සමාගම—කොළඹින් බැහැර ප්‍රදේශවල විදුලි සංදේශ සංවර්ධන යෝජනා ක්‍රමයෙහි I වන අදියර | 1969 සැප්තැම්බර් 20 |

12-1112

---

ඇල්.ඩී.—බී. 49/51

## පඩි පාලක සභා ආඥාපනත

### නිවේදනයයි

(136 වැනි අධිකාරය වන) පඩිපාලක සභා ආඥාපනතේ 30 වැනි වගන්තියෙන් මත්පැන් හා විනාකිරි කර්මාන්තය පිළිබඳ පඩිපාලක සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, මෙහි වූ උපලේඛනයෙහි නිශ්චිතව සඳහන් ස්වකීය තීරණයන් ඒ උපලේඛනයෙහි දක්වා ඇති පරිද්දෙන් වෙනස් කිරීමට එම පඩිපාලක සභාව අදහස් කරන බව යථෝක්ත ආඥාපනතේ 28 වැනි වගන්තියේ විධිවිධාන අනුව ඒ සභාව විසින් මෙයින් නිවේදනය කරනු ලැබේ.

ඉහත කී යෝජනාවට විරුද්ධව ඉදිරිපත් කරනු ලබන විරුද්ධතා 1971 ජනවාරි මස 15 දින දවල් 12 දක්වා එම පඩිපාලක සභාවේ සභාපතිවරයා විසින් භාරගනු ලැබේ.

ඉදිරිපත් කරන ඒ සෑම විරුද්ධතාවක්ම එසේ විරුද්ධ වීමට හේතුවූ කරුණු පිළිබඳ ප්‍රකාශයක් ද සහිතව, ලියවිල්ලකින් විය යුතුය.

ඩබලිව්. ඇල්. පී. ද මැල්,
මත්පැන් හා විනාකිරි කර්මාන්තය පිළිබඳ
පඩිපාලක සභාවේ සභාපති.

1970 දෙසැම්බර් මස 8 වැනි දින,
කොළඹදීය.

### උපලේඛනය

රා, අරක්කු හා විනාකිරි කර්මාන්තය පිළිබඳ පඩිපාලක සභාව විසින් ඇති කරන ලදව වර්ෂ 1946 මැයි 24 වැනි දින අංක 9,560 දරන ගැසට් පත්‍රයේ පළවූ නිවේදනයේ උපලේඛනයෙහි සවිස්තරව සඳහන්ව ඇත්තා වූ ද, වර්ෂ 1946 අගෝස්තු මස 30 වැනි දින අංක 9,594, වර්ෂ 1951 ඔක්තෝබර් මස 26 වැනි දින අංක 10,312, වර්ෂ 1952 ජනවාරි මස 25 වැනි දින අංක 10,345, වර්ෂ 1956 සැප්තැම්බර් මස 28 වැනි දින අංක 10,976, වර්ෂ 1960 ජනවාරි මස 15 වැනි දින අංක 12,036, වර්ෂ 1960 මාර්තු 4 වැනි දින අංක 12,037, වර්ෂ 1970 මැයි මස 22 වැනි දින අංක 14,907 දරන ගැසට් පත්‍රවල පළවූ නිවේදනයන්හි දක්වා ඇති පරිද්දෙන් වෙනස් කරන ලද්දාවූද තීරණ, එම උපලේඛනයේ II වැනි කොටස වෙනුවට පහත දැක්වෙන අභිනව කොටස ආදේශ කිරීමෙන් තවදුරටත් වෙනස් කළ යුතුය :—

#### II වැනි කොටස

මත් පැන් හා විනාකිරි කර්මාන්තයේ ඇතැම් කාර්යයන්ට අදළ වන්නාවූ කැලි මිම්මේ වැඩට ගෙවිය යුතු අවම වේතන ප්‍රමාණයෝ—

| කාර්‍යය | | ප්‍රමාණය | රු. | ශ. |
|---|---|---|---|---|
| පොල්ගස් ඇදීම | ... | එක් ඇළුත්තකට ... | ... 0 | 70 |
| කඹ මාරු කිරීම | ... | එක් ඇළුත්තකට ... | ... 0 | 35 |
| කඹ කපා අස් කිරීම | ... | එක් ඇළුත්තකට ... | ... 0 | 30 |
| පොල්ගස් හැර ගැනීම | ... | ගස් 110 කට වැඩි නොවන අතුරකට | ... 35 | 0 |

තැබැරුම්වලට රා සැපයීම පිණිස පොල්, කිතුල් හෝ තල් ගස් මැදීම :—

| | | රු. | ශ. |
|---|---|---|---|
| ගාලු දිස්ත්‍රික්කයේ ... | කම්කරුවකු ගෙනැවිත් දෙන රා ගැලුමකට ... | ... 0 | 54 |
| බස්නාහිර පළාතේ ... | කම්කරුවකු ගෙනැවිත් දෙන රා ගැලුමකට ... | ... 1 | 15 |
| හලාවත දිස්ත්‍රික්කයේ ... | කම්කරුවකු ගෙනැවිත් දෙන රා ගැලුමකට ... | ... 1 | 10 |
| නුවරඑළිය හෝ මහනුවර දිස්ත්‍රික්කයේ | කම්කරුවෙකු ගෙනැවිත් දෙන රා ගැලුමකට ... | ... 1 | 20 |
| මාතර, යාපනේ හෝ මාතලේ දිස්ත්‍රික්කයේ | කම්කරුවකු ගෙනැවිත් දෙන රා ගැලුමකට ... | ... 1 | 10 |
| පුත්තලම් අනුරාධපුර කුරුණෑගල හෝ හම්බන්තොට දිස්ත්‍රිකක්යේ | කම්කරුවකු ගෙනැවිත් දෙන රා ගැලුමකට ... | ... 1 | 15 |
| බදුල්ල හෝ රත්නපුර දිස්ත්‍රික්කයේ | කම්කරුවකු ගෙනැවිත් දෙන රා ගැලුමකට ... | ... 1 | 20 |
| මඩකලපුව හෝ මන්නාරම දිස්ත්‍රික්කයේ | කම්කරුවෙකු ගෙනැවිත් දෙන රා ගැලුමකට ... | ... 1 | 20 |
| කෑගලු දිස්ත්‍රික්කයේ ... | කම්කරුවකු ගෙනැවිත් දෙන රා ගැලුමකට ... | ... 0 | 80 |
| ත්‍රිකුණාමල හෝ මුලතිව් දිස්ත්‍රික්කයේ | කම්කරුවකු ගෙනැවිත් දෙන රා ගැලුමකට ... | ... 1 | 05 |
| ඉස්කාගාරවලට හෝ විනාකිරි සෑදීමට රා සැපයීම පිණිස පොල්, කිතුල් හෝ තල් ගස් මැදීම | කම්කරුවකු ගෙන විත් දෙන රා ගැලුමකට ... | ... 0 | 41 |
| ඉස්කාගාරවලට හෝ විනාකිරි සෑදීමට හෝ රා සැපයීම පිණිස මල් තැලීම | පොල් කිතුල් හෝ තල් ගස් 100 කට වැඩි නොවූ විට රු. 62 ශත 50 ක්ද 100 ට වැඩි එබඳු සෑම ගසකට ශත 62½ ක් ද වේ. | | |
| තැබැරුම්වලට රා සැපයීම පිණිස මල් තැලීම | පොල්, කිතුල් හෝ තල් ගස් 25–40 දක්වා රු. 60 යි. | | |

කම්කරුවෙකු අරක්කු කර්මාන්තය සඳහා හෝ විනාකිරි සෑදීම සඳහා හෝ රා මැදීමෙහි යොදවා ගන්නා සෑම විටෙක, පොල්, කිතුල් හෝ තල් ගස් මැදීම පිළිබඳ වූ පූර්වෝක්ත වේතන ප්‍රමාණයන් එම කම්කරුවා විසින් ගෙනැවිත් දෙන රාවල ඝන ප්‍රමාණයෙන් සියයට 7.5 කට නො අඩු මද්‍යසාර ප්‍රමාණයක් තිබිය යුතුය යන කොන්දේසියට යටත්ව අදළ විය යුතුය. එසේද වුවත්, එකී රා වල සියයට 7.5 කට අඩු ඝන ප්‍රමාණයක මධ්‍යසාරය ඇතිවූ විට, එය ගෙනැවිත් දුන් කම්කරුවාට, රා වල ඇති මධ්‍ය සාරයෙහි සියයට ප්‍රමාණය 7.5 ට සමාන වන ගනන පූර්වෝක්ත වේතන ප්‍රමාණයට සමාන වන්නේ යම් ප්‍රමාණයකට ද ඒ ප්‍රමාණයේ ගණනක් ගෙවිය යුතුය.''

12-1078

---

## පඩිපාලක සභා ආඥාපනත

### නිවේදනයයි

1970 දෙසැම්බර් මස 1 වැනි දින සිට අවුරුදු 3 ක කාලයක් තුළ සම් පදම් කිරීම, පැවහන් හා සම් භාණ්ඩ ඇදීමේ කර්මාන්තය පිළිබඳ පඩිපාලක සභාවේ සාමාජිකයන් ලෙස පෙනී සිටීමට පඩිපාලක සභා ආඥාපනතේ (136 වැනි පරිච්ඡේදය) 9 වැනි වගන්තිය යටතේ ගරු කම්කරු ඇමතිවරයා විසින් පහත නම් සඳහන් තැනැත්තන් පත් කරන ලද බව 1943 පඩිපාලක සභා පිළිබඳ ව්‍යවස්ථා සංග්‍රහයේ 26 වැනි ව්‍යවස්ථාව යටතේ මෙයින් නිවේදනය කරනු ලැබේ.

අ. එ. ගෝගලී මොරගොඩ,
ස්ථිර ලේකම්වරයා,
කම්කරු අමාත්‍යාංශය.

1970 දෙසැම්බර් මස 15 දින,
කොළඹදීය.

**නම නියමකර පත්කළ සාමාජිකයින් :**

1. ඩබ්ලිව්. බී. ධම්සේන ප්‍රනාන්දු මහතා
2. ආර්. පී. කේ. ඩී. රාජපක්ෂ මහතා
3. ඒ. බී. මැදකවල මහතා.

**සේව්‍ය නියෝජිතයින් :**

1. ඇල්. ඊ. වීරසේකර මහතා
2. ඇන්. සී. ඩී. ඩබ්ලිව්. ගුණසේකර මහතා
3. ඩී. කේ. රාජපක්ෂ මහතා
4. ඇම්. මැකී හසීම් මහතා
5. ඇස්. ඩී. ඊ. සමරසේකර මහතා
6. ඇස්. ඒ. පෙරේරා මහතා
7. ඩී. ඇන්. තුරෙයිරාජා මහතා
8. ඇම්. කනගරත්නම් මහතා
9. ඩී. සැම්සන් මහතා

10. ඇම්. ඒ. සැපිඩින් මහතා
11. ඩබ්ලිව්. ජේ. ලිවේරා මහතා
12. පී. ඉසැඩ්. බාල්දික් මහතා.

**සේවක නියෝජිතයින් :**

1. ඇස්. ලෙස්ලි ප්‍රනාන්දු මහතා
2. ඩබ්ලිව්. පී. රත්නායක මහතා
3. ඇම්. සී. ඇම්. සාපි මහතා
4. ඇම්. ඒ. හනීපා මහතා
5. පූජිත ගුණවර්ධන මහතා
6. ඇස්. සෙල්ලයියා මහතා
7. ඩබ්ලිව්. ඇල්. ප්‍රනාන්දු මහතා
8. ඔස්වින් ප්‍රනාන්දු මහතා
9. ඇන්. සරණපාල සිල්වා මහතා
10. වෝල්ටර් ජෝතිපාල මහතා
11. ඒ. ඇන්. ඒ. කාදර් මහතා
12. ඒ. එච්. ඒ. සමීන් මහතා.

12-1055

---

## 1968 අංක 14 දරන සංචාරික සංවර්ධන පනත

**නියෝගය**

1968 අංක 14 දරන සංචාරික සංවර්ධන පනතේ 9 වැනි වගන්තියෙහි (1) උප වගන්තියෙන් මා වෙත පවරනු ලැබූ බලතල ප්‍රකාර, නැව් කටයුතු හා සංචාරක කටයුතු ඇමති, පුංචි බණ්ඩා ගුණතිලක කලුගල්ල වන මම, රාජ්‍ය පරිපාලන, පළාත් පාලන සහ ස්වදේශ කටයුතු පිළිබඳ ඇමතිවරයාගේ එකඟත්වය ඇතිව, මෙම නියෝගයෙහි උපලේඛනයේ දැක්වෙන තානායම, මෙම නියෝගය මගින් ලංකා සංචාරක මණ්ඩලය වෙත පවරමි.

පී. බී. ජී. කලුගල්ල,
නැව් කටයුතු හා සංචාරක කටයුතු ඇමති.

1970 දෙසැම්බර් මස 2 දින.

### උපලේඛනය

මැද පළාතේ, නුවරඑළිය දිස්ත්‍රික්කයේ, වලපනේ ප්‍රා. ආ. නි. කොට්ඨාශයෙහි ඔය පළාත කෝරලයෙහි, මහ එළිය හෙවත් හෝර්ටන් ප්ලේන්ස්'හි පිහිටා ඇති—

උතුරට සහ නැගෙනහිරට : දියගම වර්ල්ඩ්ස් එන්ඩ් දක්වා දිවෙන පාර ;
දකුණට : රජයේ ඉඩම සහ පාර ;
බටහිරට : රජයේ ඉඩම සහ අඩි පාර.

මායිම් වූ බලය ලත් මිනින්දෝරු සහ මට්ටම් සැලසුම්කරු සිරි බී. ලියනසූරිය විසින් සැදන ලද අංක 197 සහ 1968 නොවැම්බර් 9 දින දරන පිඹුරෙහි පෙන්නුම් කර ඇති සහ වඩාත් විස්තර කර ඇති, ප්‍රමාණයෙන් අක්කර 6, රූඩ් 0, පර්. 17.0 කින් සමන්විත වූ 'පාර් ඉන්' තානායම යයි හැඳින්වෙන සහ දක්වෙන සියළුම ඉඩම් සහ එහි පිහිටි ගොඩනැගිලි.

12-1330

---

ඇල්. ඩී.—බී. 23/63

## 1963 අංක 11 දරණ මුදල් පනත

**ජාතික ලොතරැයි රීති**

1963 අංක 11 දරන මුදල් පනතේ 11 (අ) වැනි සහ 20 වැනි වගන්ති යටතේ ජාතික ලොතරැයි මණ්ඩලය විසින් සම්පාදිතව, එම පනතේ 20 වැනි වගන්තිය යටතේ මුදල් ඇමතිවරයා විසින් අනුමත කරන ලද රීතිය.

සී. ඒ. කූරේ,
මුදල් අමාත්‍යාංශයේ ස්ථිර ලේකම් වෙනුවට.

1970. 12. 17 දින,
කොළඹ දීය.

**රීතිය**

1970 පෙබරවාරි 5 වැනි දින අංක 14,892 දරන ගැසට් පත්‍රයේ පළ කරන ලද 1967 ජාතික ලොතරැයි මණ්ඩලය (අංක 2 දරන රීති) පහත සඳහන් පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

(1) එහි වූ 2 වැනි රීතියෙහි—

(අ) "පන්ති දෙකකට" යන යෙදුම වෙනුවට "පන්ති තුනකට" යන යෙදුම ආදේශ කිරීමෙන් ;

(ආ) එහි වූ (2) වැනි ඡේදයට ඉක්බිතිවම පහත සඳහන් අළුත් ඡේදය එකතු කිරීමෙන් :—

"(3) එකක් ශත 50 බැගින් ටිකට් පත් විකිණිය යුතු "විශේෂ ලොතරැයිය" යනුවෙන් නම් කර ඇති ජාතික ලොතරැයිය."

(2) 4 වැනි රීතියට ඉක්බිතිවම පහත සඳහන් අළුත් රීතිය එකතු කිරීමෙන් :—

"4 අ. 2 (3) වැනි රීතිය යටතේ නිශ්චය කොට දක්වා ඇති "විශේෂ ලොතරැයිය" යනුවෙන් නම් කර ඇති ජාතික ලොතරැයිය සම්බන්ධයෙන්—

(i) මණ්ඩලය විසින් එක් එක් වර්ෂයක දී තීරණය කළ යුතු සංඛ්‍යාවක "විශේෂ ලොතරැයි" ගණනක් තිබිය යුතු ය ;

(ii) "විශේෂ ලොතරැයියේ" සෑම ටිකට් පතක්ම ශත 50 ක මිලකට විකිණිය යුතු ය ;

(iii) සෑම ටිකට් පතකම ඉදිරි පැත්තෙහි එම ලොතරැයිය ඇදිනු ලබන දිනය සහ වේලාව සඳහන් විය යුතු ය ;

(iv) මණ්ඩලය විසින් තීරණය කරනු ලබන අන්දමේ නියෝජිතයින් වෙත ටිකට් පත් නිකුත් කළ යුතු ය ;

(v) එම "විශේෂ ලොතරැයියේ" ත්‍යාගයන් පහත සඳහන් විධිවිධානයන්ට අනුකූලව ප්‍රදානය කළ යුතු ය :—

(අ) මෙම රීතියේ සඳහන් විධිවිධානයන්ට යටත්ව එම විශේෂ ලොතරැයියේ දළ ලාභයෙන් සියයට හතලිහක ප්‍රමාණයක් පමණක් ත්‍යාගයන් බෙදාදීම සඳහා ප්‍රයෝජනයට ගත යුතුය.

(ආ) දළ ලාභයෙන් සියයට විස්සක් වන ප්‍රථම ත්‍යාග මුළුවක්, එකක් රුපියල් 5,000 බැගින් වන ත්‍යාගවලට බෙදිය යුතුය. එයින් ඉතිරි වන මුදල දළ ලාභයෙන් සියයට අටක් වන දෙවැනි ත්‍යාග මුළුවට එකතු කර එකක් රුපියල් 2,000 බැගින් වන ත්‍යාගවලට බෙදිය යුතුය. එයින් ඉතිරිවන මුදල දළ ලාභයෙන් සියයට දෙකක් වන තුන් වැනි ත්‍යාග මුළුවට එකතු කර එකක් රුපියල් 1,000 බැගින් වන ත්‍යාගවලට බෙදිය යුතුය. එයින් ඉතිරි වන මුදල දළ ලාභයෙන් සියයට දහයක් වන සැනසිලි ත්‍යාග මුළුවට එකතු කර සමාන ත්‍යාග 50 කට බෙදිය යුතුය.";

(3) (අ) 6 වැනි රීතිය 6 (1) වැනි රීතිය වශයෙන් නැවත අංක කිරීමෙන් ;

(ආ) 6 (1) වැනි රීතියට ඉක්බිතිව ම පහත සඳහන් අළුත් රීතිය එකතු කිරීමෙන් :—

"6 (2) ඉරුණු, විකලවුනු හෝ විරූපවුනු ලොතරැයි ටිකට් පතක් යම් ත්‍යාගයක් ලැබීම සඳහා සුදුසු නොවිය යුතුය :

එසේ වුව ද එබඳු යම් ටිකට් පතක අයිතිකරු විසින්, එසේ ඉරුණු විකලවුණු හෝ විරූපවුණු ලොතරැයි ටිකට් පතක තථ්‍ය භාවය සහතික කිරීම සඳහා කැඳවනු ලැබිය හැකි ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපතිගේ, ආණ්ඩුවේ රස පරීක්ෂකගේ හෝ වෙනත් යම් තැනැත්තකුගේ වියදම් ගෙවීම සඳහා අවශ්‍ය විය හැකි තරම් මුදලක් මණ්ඩලයෙහි තැන්පත් කළ යුතු ය."

12-1067

---

## 1958 අංක 13 දරණ වරාය (නැව්බඩු) සංයුක්ත මණ්ඩල ආඥපනත

1961 අංක 67 හා 1964 අංක 41 දරණ වරාය (නැව්බඩු) සංයුක්ත මණ්ඩලීය ආඥපනත් වලින් සංශෝධිත 1958 අංක 13 දරන වරාය (නැව්බඩු) සංයුක්ත මණ්ඩල ආඥපනතේ 49 (2) වැනි වගන්තියෙන් තමා වෙත පැවරී ඇති බලතල අනුව, එකී පනතේ 48 වැනි වගන්තිය යටතේ ත්‍රිකුණාමලයේ හිටපු වරාය ව්‍යාපාරිකයන්ගේ ආයාචනා සලකා බැලීමේ සමාලෝචන මණ්ඩලයේ සාමාජිකයින් වශයෙන්, ඒ. සී. කනගසිංහම්, ඇස්. ඇම්. ඒ. ජමලුදීන් සහ කේ. ජී. රත්නපාල යන මහත්වරුන් 1970 දෙසැම්බර් මස 1 වැනි දින සිට තුන් මසක කාලපරිච්ඡේදයකට පත් කිරීමට ගරු නැව් කටයුතු හා සංචාරක කටයුතු ඇමති තුමා කටයුතු කර ඇති බව මහජනයාගේ දැනගැනීම පිණිස මෙයින් නිවේදනය කරනු ලැබේ.

තවද, ඉහතකී සමාලෝචන මණ්ඩලයේ සභාපති වශයෙන්, ඒ. සී. කනගසිංහම් මහතා ගරු ඇමති තුමා විසින් පත්කර ඇත.

පී. බී. කරඳවල,
නැව් කටයුතු හා සංචාරක කටයුතු අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්.

1970 දෙසැම්බර් මස 18 වැනි දින,
කොළඹ 1,
නැව් කටයුතු හා සංචාරක කටයුතු අමාත්‍යාංශයේදී ය.

12-1065

## විවේචන මණ්ඩලය

### ආදායම් බදු ආඥාපනත යටතේ සහ දේශීය ආදායම් පනත යටතේ පත් වීම්

ගරු මුදල් ඇමතිතුමා විසින් ආදායම් බදු ආඥාපනතේ (242 වැනි පරිච්ඡේදය) 74 (1) වගන්තිය යටතේ සහ දේශීය ආදායම් පනතේ 98 (1) වගන්තිය යටතේ පහත නම් සඳහන් අය ඔවුන්ගේ නම්වලට ඉදිරියෙන් දක්වා ඇති දින සිට අවුරුදු තුනක කාලපරිච්ඡේදයකට විවේචන මණ්ඩලයේ සාමාජිකයින් වශයෙන් පත් කරන ලදී :—

1. එච්. සී. ගුණවර්ධන මහතා ... 71.1.2
2. සී. බාලසිංහම් මහතා ... 71.1.2
3. සී. පී. සී. එම්. ද සිල්වා මහතා ... 71.2.5

කේ. සිත්තම්බලම්,
මුදල් අමාත්‍යාංශයේ ස්ථිර ලේකම් වෙනුවට.

1970 දෙසැම්බර් 21 දින,
මුදල් අමාත්‍යාංශය,
කොළඹ.

12-1111/1

---

## සමගි මණ්ඩල පනත

### ආඥාව

1959 අංක 4 දරන පනතින් සංශෝධිත 1946 ලංකා (ආණ්ඩු ක්‍රම) රාජසභා ආඥාවේ 47 (2) වන වගන්තිය යටතේ පනවනු ලැබ 1970 ජූනි 16 වන දින අංක 14,910/8 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබූ නිවේදනය සමග කියවිය යුතු 1963 අංක 12 දරන පනතින් සංශෝධිත 1958 අංක 10 දරන සමගි මණ්ඩල පනතේ 3 (1), 3 (8) හා 4 (1) වන වගන්තිවලින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, අධිකරණ ඇමතිවරයාගේ පාර්ලිමේන්තු ලේකම් රත්නසිරි වික්‍රමනායක වන මම—

(අ) 1969 දෙසැම්බර් 26 වැනි දින අංක 14,886 දරන ගැසට් පත්‍රයෙහි ප්‍රසිද්ධ කරනු ලැබූ 1958 අංක 10 දරන සමගි මණ්ඩල පනතෙහි 3 (2) වන වගන්තිය යටතෙහි වූ දැන්වීමේ උපලේඛනයෙහි අංක 35 දරණ ස්ථානයෙහි විස්තර කරනු ලැබූ මාරපන ගම් ප්‍රදේශය සඳහා පිහිටුවනු ලැබූ සමගිදායකයින්ගේ සභාවේ සාමාජිකයන් වශයෙන් පහත සඳහන් තැනැත්තන් මෙයින් පත් කරමි :—

1. මාරපන, මාරපන විද්‍යාලයෙහි රොබර්ට් පොතුවිල මහතා
2. ලෙල්ලොපිටිය, බෝපැත්ත පදිංචි ගගබඩ මුරුතැන් රාලලාගේ චන්ද්‍රනාහාමි මහතා
3. ලෙල්ලොපිටිය, බොපැත්ත පදිංචි බෝපැත්තෙ විදානෙලාගේ කිරිමැණිකේ මහතා
4. ලෙල්ලොපිටිය, වැලිමළුව පදිංචි දොලොස්වල ආරච්චිගේ ජයසේකර මහතා
5. ලෙල්ලොපිටිය, ගෝනකුඹුර පදිංචි හේවානම්මුණි ආරච්චිගේ හීන් මහත්මයා මහතා
6. ලෙල්ලොපිටිය, දෙවනගම්මන පදිංචි හිරිලියැද්දේ විදානෙලාගේ පොඩි මහත්මයා මහතා
7. ඇල, මාවුඇල්ල පදිංචි තුන්බෝවිලගෙ ඩිංගිරි මුදියන්සේ මහතා
8. ලෙල්ලොපිටිය, වැලිමළුව පදිංචි කඩුගම්මුල්ලගේ ජේම්ස් සිංඤෝ මහතා
9. ලෙල්ලොපිටිය, පතුල්පාන, අංක 6, "ස්වර්ණානී" හි පදිංචි කහඳවල ආරච්චිගේ දොන් කරෝලිස් අප්පුහාමි මහතා
10. මාරපන, "අළුත් වලව්ව" හි පදිංචි ජයසිංහ මුදියන්සේලාගේ ගුණදාස බණ්ඩාර මහතා
11. මාරපන, "ගඟ අද්දර වලව්ව" හි පදිංචි වෙල්ලන්කට්ටු මුදියන්සේලාගෙ තෙන්නකෝන් බණ්ඩාර මහතා
12. මාරපන, මල්වත්ත පදිංචි මල්වත්ත මනන්නලාගේ ගුණසිරියා මහතා
13. මාරපන, හකමුව පදිංචි හකමුව මනන්නලාගේ සුවඳ රත්න මහතා
14. මාරපන, පහලවෙල පදිංචි පහල කුළුඹුරේ කංකානමලායෙ හීන් මහත්මයා මහතා
15. ඇල, පණිගම පදිංචි අලුපොත ආරච්චිලාගේ නාගින්න වත්තෙ ඩිංගිරි මහත්මයා මහතා
16. රත්නපුර, නිරල්ගම පදිංචි අප්පුහාමිගෙ පුංචිඅප්පුහාමි රාමනායක මහතා
17. උඩකරවිට, අලුපොත පදිංචි පට්ටිය ආරච්චිල්ලාගේ අසෝක ගුණවර්ධන මහතා
18. රත්නපුර, නිරල්ගම පදිංචි මාටින් ආතර් රාමනායක මහතා
19. මාරපන, හකමුව පදිංචි හකමුව මනන්නලාගේ සයිමන් මහතා
20. රත්නපුර, අංගම්මන, විහාර පාරේ පදිංචි උක්කුවලාගේ සිමියොන් මහතා

(ආ) මාරපන, මාරපන විද්‍යාලයෙහි රොබර්ට් පොතුවිල මහතා ඉහත කී සභාවෙහි සභාපති වශයෙන් මෙයින් පත් කරමි.

(ඇ) ඉහත කී සභාවේ සාමාජිකයෙකු වශයෙන් ඒ එක් එක් තැනැත්තකු පත් කරනු ලබන කාලය මේ ආඥාව ගැසට් පත්‍රයෙහි ප්‍රසිද්ධ කරනු ලබන දිනයේ සිට අවුරුදු 3 ක් විය යුතු බව ද මෙයින් නිශ්චය කරමි.

රත්නසිරි වික්‍රමනායක,
අධිකරණ ඇමතිවරයාගේ
පාර්ලිමේන්තු ලේකම්.

1970 දෙසැම්බර් මස 18 වැනි දින,
කොළඹ, අධිකරණ අමාත්‍යාංශයේ දී ය.

12-1057

---

## සමගි මණ්ඩල පනත

1959 අංක 4 දරණ පනතින් සංශෝධිත 1946 ලංකා (ආණ්ඩු ක්‍රම) රාජසභා ආඥාවේ 47 (2) වන වගන්ති යටතේ පනවනු ලැබ, 1970 ජූනි 16 වන දින අංක 14,910/8 දරණ අති විශෙෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබූ නිවේදනය සමග කියවිය යුතු 1963 අංක 12 දරණ පනතින් සංශෝධිත 1958 අංක 10 දරණ සමගි මණ්ඩල පනතේ 2 වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල පාවිච්චි කරමින්, අධිකරණ ඇමතිවරයාගේ පාර්ලිමේන්තු ලේකම්, රත්නසිරි වික්‍රමනායක වන මම, මීට යාකොට ඇති උපලේඛනයෙහි නිශ්චිත ව සඳහන් ප්‍රදේශ තුළ එකී පනත ක්‍රියාත්මක විය යුතු යයි මෙයින් නිශ්චය කරමි.

රත්නසිරි වික්‍රමනායක,
අධිකරණ ඇමතිවරයාගේ පාර්ලිමේන්තු ලේකම්.

1970 දෙසැම්බර් මස 19 වැනි දින,
කොළඹ, අධිකරණ අමාත්‍යාංශයේ දීය.

### උපලේඛනය

1. කොළඹ දිස්ත්‍රික්කය තුළ පිහිටි කොළඹ මහ නගර සභාවේ පහත සඳහන් එක් එක් කොට්ඨාශ ඇතුළත් ප්‍රදේශ :—

ප්‍රදේශ අංක 1, ඡන්ද කොට්ඨාශ අංක 31—කුප්පියවත්ත නැගෙනහිර,

ප්‍රදේශ අංක 2, ඡන්ද කොට්ඨාශ අංක 33—බොරැල්ල උතුර,

ප්‍රදේශ අංක 3, ඡන්ද කොට්ඨාශ අංක 35—බොරැල්ල දකුණ,

ප්‍රදේශ අංක 4, ඡන්ද කොට්ඨාශ අංක 36—කුරුඳුවත්ත.

12-1058

---

## සමගි මණ්ඩල පනත

### 3(2) වන වගන්තිය යටතේ වූ දැන්වීම

1959 අංක 4 දරණ පනතින් සංශෝධිත 1946 ලංකා (ආණ්ඩු ක්‍රම) රාජසභා ආඥාවේ 47 (2) වන වගන්තිය යටතේ පනවනු ලැබ 1970 ජූනි 16 වන දින අංක 14,910/8 දරණ අති විශෙෂ ගැසට් නිවේදනය සමග කියවිය යුතු 1963 අංක 12 දරණ පනතින් සංශෝධිත 1958 අංක 10 දරණ සමගි මණ්ඩල පනතේ 3 වන වගන්තියේ (2) වන උප වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල පාවිච්චි කරමින්, අධිකරණ ඇමතිවරයාගේ පාර්ලිමේන්තු ලේකම්, රත්නසිරි වික්‍රමනායක වන මම, මීට යාකොට ඇති උපලේඛනයෙහි නිශ්චිත ව සඳහන් එක් එක් ප්‍රදේශය සඳහා සමගිදායකයින් ගේ මණ්ඩලයක් සංස්ථාපනය කිරීමට අදහස් කරන බවත්, ඒ එක් එක් ප්‍රදේශයෙහි සමගිදායකයින්ගේ මණ්ඩලයට පත් කළ යුතු තැනැත්තන් සම්බන්ධයෙන් ඒ වගන්තියේ (3) වන උප වගන්තිය යටතේ නිර්දේශයන් ප්‍රාදේශීය ආදායම් පාලක නිලධාරි තැනගේ කාර්යාලයේ ඇති ආකෘති පත්‍රය මගින් 1971 පෙබරවාරි 28 වන දින හෝ ඊට පෙර මා වෙත ඉදිරිපත් කළ හැකි බවත් මෙයින් දැනුම් දෙමි.

මොරටුව පළාත් ආණ්ඩු සභා ප්‍රදේශය වෙනුවෙන් සමගි මණ්ඩල පනත යටතේ අංක 14,921 හා 1970 අගෝස්තු 28 වැනි දින පළ කෙරුන ගැසට් නිවේදනය මෙයින් අවලංගු කරමි.

රත්නසිරි වික්‍රමනායක,
අධිකරණ ඇමතිවරයාගේ පාර්ලිමේන්තු ලේකම්.

1970 දෙසැම්බර් මස 21 වැනි දින,
කොළඹ, අධිකරණ අමාත්‍යාංශයේ දීය.

## උපලේඛනය

1. කොළඹ දිස්ත්‍රික්කය තුළ පිහිටි මොරටුව පළාත් ආණ්ඩු සභාවේ පහත සඳහන් කොට්ඨාශ හත ඇතුළත් ප්‍රදේශය (මොරටුව උතුර) :—

කොට්ඨාශ අංක 1—ලක්ෂපතිය-කල්දෙමුල්ල,
කොට්ඨාශ අංක 2—කටුබැද්ද,
කොට්ඨාශ අංක 3—රාවතාවත්ත,
කොට්ඨාශ අංක 4—විල්ලොරාවත්ත-මෝල්පේ,
කොට්ඨාශ අංක 5—ඉඳිබැද්ද,
කොට්ඨාශ අංක 6—මොරටුමුල්ල,
කොට්ඨාශ අංක 7—ඉඹම.

2. කොළඹ දිස්ත්‍රික්කය තුළ පිහිටි මොරටුව පළාත් ආණ්ඩු සභාවේ පහත සඳහන් කොට්ඨාශ පහ ඇතුළත් ප්‍රදේශය (මොරටුව දකුණ) :—

කොට්ඨාශ අංක 8—උයන,
කොට්ඨාශ අංක 9—මොරටුවැල්ල,
කොට්ඨාශ අංක 10—කොරළවැල්ල,
කොට්ඨාශ අංක 11—කටුකුරුන්ද,
කොට්ඨාශ අංක 12—එගොඩඋයන.

12-1110

---

## සමගි මණ්ඩල පනත

1959 අංක 4 දරණ පනතින් සංශෝධිත 1946 ලංකා (ආණ්ඩු ක්‍රම) රාජසභා ආඥාවේ 47 (2) වන වගන්තිය යටතේ පනවනු ලැබ 1970 ජූනි 16 වන දින අංක 14,910/8 දරණ අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබූ නිවේදනය සමග කියවිය යුතු 1963 අංක 12 දරණ පනතින් සංශෝධිත 1958 අංක 10 දරණ සමගි මණ්ඩල පනතේ 4 (1) වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල පාවිච්චි කරමින්, අධිකරණ ඇමතිවරයාගේ පාර්ලිමේන්තු ලේකම්, රත්නසිරි වික්‍රමනායක වන මම කොළඹ දිස්ත්‍රික්කය තුළ පිහිටි උඩුගහ ගම් ප්‍රදේශයේ සමගිදායකයින්ගේ සභාවේ සභාපති ව සිට එම ධුරයෙන් ඉල්ලා අස් වූ අශෝපුස්ස, කැබැල්ලවිට පදිංචි කුමාර අප්පුහාමිලාගේ අබේසේකර මහතා වෙනුවට, කිතලවිලාන, බැද්දෙගෙදර පදිංචි පෙරුම්බුලි ආරච්චිගේ ගුණතිලක මහතා එකී සභාවේ සාමාජික ධුරය දරන කාලය තුළ දී එම සභාවෙහි සභාපති වශයෙන් මෙයින් පත් කරමි.

රත්නසිරි වික්‍රමනායක,
අධිකරණ ඇමතිවරයාගේ
පාර්ලිමේන්තු ලේකම්.

1970 දෙසැම්බර් 21 වැනි දින,
කොළඹ, අධිකරණ අමාත්‍යාංශයේ දී ය.

12-1109

---

## සමගි මණ්ඩල පනත

### ආඥාව

1959 අංක 4 දරණ පනතින් සංශෝධිත 1946 ලංකා (ආණ්ඩු ක්‍රම) රාජසභා ආඥාවේ 47 (2) වන වගන්තිය යටතේ පනවනු ලැබ 1970 ජූනි 16 වන දින අංක 14,910/8 දරණ අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබූ නිවේදනය සමග කියවිය යුතු 1963 අංක 12 දරණ පනතින් සංශෝධිත 1958 අංක 10 දරණ සමගි මණ්ඩල පනතේ 3 (1), 3 (8) හා 4 (1) වන වගන්ති වලින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර අධිකරණ ඇමතිවරයාගේ පාර්ලිමේන්තු ලේකම් රත්නසිරි වික්‍රමනායක වන මම—

(අ) 1969 දෙසැම්බර් 26 වැනි දින අංක 14,886 දරණ ගැසට් පත්‍රයෙහි ප්‍රසිද්ධ කරනු ලැබූ 1958 අංක 10 දරණ සමගි මණ්ඩල පනතෙහි 3 (2) වන වගන්තිය යටතෙහි වූ දැන්වීමේ උපලේඛනයෙහි අංක 30 දරණ ස්ථානය විස්තර කරනු ලැබූ අඹංගග කෝරළය ගම් ප්‍රදේශය සඳහා පිහිටුවනු ලැබූ සමගිදායකයින්ගේ සභාවේ සාමාජිකයන් වශයෙන් පහත සඳහන් තැනැත්තන් මෙයින් පත් කරමි :—

1. ගම්මඩුව, කුඹල්ඔළුව පදිංචි හෙට්ටි මුදියන්සේලාගේ මුතු බණ්ඩා මහතා
2. කයිකාවල, මැටිහක්ක පදිංචි හඳුගහකොටුවේ හේරත් මුදියන්සේලාගේ පුංචිරාල හේරත් මහතා
3. ගම්මඩුව, කුඹල්ඔළුව පදිංචි හේරත් මුදියන්සේලා අලවත්තාපිටියේ ගෙදර ජයසේන මහතා
4. ගම්මඩුව, කොස්ගොල්ල පදිංචි අළුත්ගෙදර පුංචි බණ්ඩා මහතා
5. ගම්මඩුව, කොස්ගොල්ල පදිංචි ඇලයේතෝ ගමරාලලාගේ අළුත්ගෙදර කීරාල මහතා
6. ගම්මඩුව, දඹගහමුදුන පදිංචි පේරගොල්ලේ ගෙදර ජයවර්ධන බණ්ඩා මහතා
7. ගම්මඩුව, ඉඹුල්ගොල්ල පදිංචි උඩගෙදර මුතු බණ්ඩා මහතා
8. ගම්මඩුව, පුස්සැල්ල පදිංචි දඹගොල්ලේ ගෙදර කරුණාදාස මහතා
9. රත්තොට, ඇහැලගස්තැන්න පදිංචි කිරාඳුරයාලා ගෙදර බොදියා මහතා
10. රත්තොට, හුණුකැටේ පදිංචි කීර්තිරත්න රාජපක්ෂගේ විජයරත්න මහතා
11. ගම්මඩුව, පුස්සැල්ල එලමල්දෙනියේ ගෙදර සුබසිංහ මහතා
12. මඩවලඋල්පත, ආඳාවල පදිංචි ගල්සොටුවේ ගෙදර සොමලියා මහතා
13. මාතලේ, ඕපල්ගල පදිංචි හේරත් මුදියන්සේලාගේ උඩගෙදර උක්කු බණ්ඩා මහතා
14. කයිකාවෙල, මැටිහක්ක පදිංචි වාසල විජේතුංග මුදියන්සෙලාගේ රහල් ඇල්ලේ කිරි බණ්ඩා මහතා
15. කයිකාවෙල, හුනුකැටඇල පදිංචි කොස්ගහ ගෙදර සිරිසේන මහතා
16. කයිකාවෙල, රයිතලාව පදිංචි කාන්ගු මුදියන්සේලාගේ එගොඩ ගෙදර මුතු බණ්ඩා මහතා
17. රත්තොට, ඇහැලගස්තැන්න පදිංචි රත්තොට ගෙදර ගුණරත්න මහතා
18. ගම්මඩුව, නාගුලියද්ද පදිංචි වෙඩික්කාරගෙදර කලු බණ්ඩා මහතා
19. ඕපල්ගල, අඹන පදිංචි වෙඩික්කාර ගෙදර ජුසේ අප්පුහාමි රත්නායක මහතා
20. රත්තොට, ඇහැලගස්තැන්න පදිංචි ඇමුද්දර ගෙදර පියදාස මහතා.

(ආ) ගම්මඩුව, කුඹල්ඔළුව පදිංචි හෙට්ටි මුදියන්සේලාගේ මුතු බණ්ඩා මහතා ඉහත කී සභාවෙහි සභාපති වශයෙන් මෙයින් පත් කරමි.

(ඇ) ඉහත කී සභාවේ සාමාජිකයෙකු වශයෙන් ඒ එක් එක් තැනැත්තකු පත් කරනු ලබන කාලය මේ ආඥාව ගැසට් පත්‍රයෙහි ප්‍රසිද්ධ කරනු ලබන දිනයේ සිට අවුරුදු 3 ක් විය යුතු බව ද මෙයින් නිශ්චය කරමි.

රත්නසිරි වික්‍රමනායක,
අධිකරණ ඇමතිවරයාගේ පාර්ලිමේන්තු ලේකම්.

1970 දෙසැම්බර් මස 19 වැනි දින,
කොළඹ, අධිකරණ අමාත්‍යාංශයේ දී ය.

12-1224/1

---

## සමගි මණ්ඩල පනත

### ආඥාව

1959 අංක 4 දරණ පනතින් සංශෝධිත 1946 ලංකා (ආණ්ඩු ක්‍රම) රාජසභා ආඥාවේ 47 (2) වන වගන්තිය යටතේ පනවනු ලැබ 1970 ජූනි 16 වන දින අංක 14,910/8 දරණ අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබූ නිවේදනය සමග කියවිය යුතු 1963 අංක 12 දරණ පනතින් සංශෝධිත 1958 අංක 10 දරණ සමගි මණ්ඩල පනතේ 3(1), 3(8) හා 4(1) වන වගන්තිවලින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, අධිකරණ ඇමතිවරයාගේ පාර්ලිමේන්තු ලේකම් රත්නසිරි වික්‍රමනායක වන මම—

(අ) 1970 ජූලි 28 වැනි දින අංක 14,916/4 දරණ අති විශේෂ ගැසට් පත්‍රයෙහි ප්‍රසිද්ධ කරනු ලැබූ 1958 අංක 10 දරණ සමගි මණ්ඩල පනතෙහි 3(2) වන වගන්තිය යටතෙහි වූ දැන්වීමේ උපලේඛනයෙහි අංක 5 දරණ ස්ථානයෙහි විස්තර කරනු ලැබූ බෝගොඩ උතුර ගම් ප්‍රදේශය සඳහා පිහිටුවනු ලැබූ සමගිදායකයින්ගේ සභාවේ සාමාජිකයන් වශයෙන් පහත සඳහන් තැනැත්තන් මෙයින් පත් කරමි :—

(1) හාලිඇල, හැනැප්ම, ශ්‍රී සුදර්මාරාමය වාසී පූජ්‍ය බුලත්වත්තේ පියදස්ස ස්ථවිරයන් වහන්සේ,
(2) කන්දෙගෙදර, ලුණුගල්ල, ශ්‍රී විද්‍යාසාගර පිරිවෙන වාසී ඇල්වත්තේ රතනසාර ස්ථවිරයන් වහන්සේ,
(3) ලන්දෙවෙල, කැටවල, හෙලවත්තකඩේ පදිංචි රත්නායක මුදියන්සේලාගේ සුදු බණ්ඩා මහතා,

(4) ලන්දෙවෙල, තැපැල්හලෙහි හේමසිරි අබේසිරිවර්ධන මහතා,

(5) ලන්දෙවෙල, දීගල්ල පදිංචි පේමසිරි ඇතුළත් මුදලි මහතා,

(6) ලන්දෙවෙල පදිංචි තෙන්නකෝන් මුදියන්සේලාගේ ගුණසේකර මහතා,

(7) ලන්දෙවෙල පදිංචි තෙන්නකෝන් මුදියන්සේලාගේ ආරියදාස මහතා,

(8) හාලිඇල, හැතැක්ම, එරමුදුගොල්ල පදිංචි දිසානායක මුදියන්සේලාගේ කිරිවන්තේ මහතා,

(9) හාලිඇල, පට්ටිපොල පදිංචි දිසානායක මුදියන්සේලාගේ කලු බණ්ඩා මහතා,

(10) හාලිඇල, හැතැක්ම පදිංචි ජයසූරිය ගුරුගේ මාටින් මහතා,

(11) ලන්දෙවෙල, කැටවල, හිඹිලිගහඅරාව පදිංචි තෙන්නකෝන් මුදියන්සේලාගේ අප්පුහාමි මහතා,

(12) හාලිඇල, හැතැක්ම, මීගහඇල්ල පදිංචි දිසානායක මුදියන්සේලාගේ කිරිබණ්ඩා මහතා,

(13) හාලිඇල, හැතැක්ම, මීගහඇල්ල පදිංචි දිසානායක මුදියන්සේලාගේ අප්පුහාමි මහතා.

(14) ලන්දෙවෙල, දීගල්ල, "ගුණසිරි නිවස" හි පදිංචි වීරසිංහ මුදියන්සේලාගේ ධර්මසිරි වික්‍රමරත්න මහතා,

(15) කන්දෙගෙදර, කඳුර, දෙහිගොල්ල පදිංචි දිසානායක මුදියන්සේලාගේ තිසාහාමි මහතා,

(16) ලන්දෙවෙල, ලුණුගල්ල බැද්දේවැවේගෙදර පදිංචි ගම්හේවලාගේ අන්දිරිස් මහතා,

(17) ලන්දෙවෙල, ජගුල්ල පදිංචි රාජපක්ෂ දේවයලාගේ කරෝලිස් මහතා,

(18) ලන්දෙවෙල, වැගම, හැවනේගෙදර පදිංචි ගම්හේවයලාගේ ජේම්ස් මහතා.

(19) ලන්දෙවෙල, බෝගොඩ, මහකුඹුර පදිංචි සමරකෝන් මුදියන්සේලාගේ කිරි බණ්ඩා සමරකෝන් මහතා,

(20) ලන්දෙවෙල, හිඹිලියගහ උඩහ ගෙදර පදිංචි ජයසිංහ මුදියන්සේලාගේ ආරියරත්න මහතා,

(21) ලන්දෙවෙල, පනාකන්නිය, දමුනුගහ අරාවේ ගෙදර පදිංචි දිසානායක මුදියන්සේලාගේ තිසාහාමි මහතා,

(22) ලන්දෙවෙල, බෝගොඩ පදිංචි ජයසුන්දර මුදියන්සේලාගේ ජයවික්‍රම මහතා,

(23) ලන්දෙවෙල, බෝගොඩ, "ශාන්ත" හි පදිංචි හඳපාන් ගොඩගේ මාටින් පීරිස් මහතා,

(24) ලන්දෙවෙල, බෝගොඩ, පදිංචි තෙන්නකෝන් මුදියන්සේලාගේ රම්මල්හාමි මහතා.

(ආ) ලන්දෙවෙල, කැටවල, හෙලවත්තේකඩේ පදිංචි රත්නායක මුදියන්සේලාගේ සුදු බණ්ඩා මහතා ඉහත කී සභාවෙහි සභාපති වශයෙන් මෙයින් පත් කරමි.

(ඇ) ඉහත කී සභාවේ සාමාජිකයෙකු වශයෙන් ඒ එක් එක් තැනැත්තකු පත් කරනු ලබන කාලය මේ ආඥාව ගැසට් පත්‍රයෙහි ප්‍රසිද්ධ කරනු ලබන දිනයේ සිට අවුරුදු 3 ක් විය යුතු බව ද මෙයින් නිශ්චය කරමි.

(ඈ) අංක 14,754 හා 1968.3.22 දින දරණ ගැසට් පත්‍රයේ පළවුන නිවේදනයෙන් මෙම ප්‍රදේශය සඳහා පත් කරන ලද සමගිදායකයින්ගේ සභාව, මෙම නිවේදනය ගැසට් පත්‍රයේ පළවින දිනයේ සිට අවලංගු වේ.

රත්නසිරි වික්‍රමනායක,
අධිකරණ ඇමතිවරයාගේ පාර්ලිමේන්තු ලේකම්.

1970 දෙසැම්බර් මස 22 දින,
කොළඹ, අධිකරණ අමාත්‍යාංශයේ දී ය.

12-1224/2

---

## සමගි මණ්ඩල පනත

### ආඥාව

1959 අංක 4 දරන පනතින් සංශෝධිත 1946 ලංකා (ආණ්ඩු ක්‍රම) රාජසභා ආඥාවේ 47(2) වන වගන්තිය යටතේ පනවනු ලැබ 1970 ජූනි 16 වන දින අංක 14,910/8 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබූ නිවේදනය සමග කියවිය යුතු 1963 අංක 12 දරන පනතින් සංශෝධිත 1958 අංක 10 දරන සමගි මණ්ඩල පනතේ 3(1), 3(8) හා 4(1) වන වගන්තිවලින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, අධිකරණ ඇමතිවරයාගේ පාර්ලිමේන්තු ලේකම් රත්නසිරි වික්‍රමනායක වන මම—

(අ) 1970 ජූලි 28 වැනි දින අංක 14,916/4 දරන අති විශේෂ ගැසට් පත්‍රයෙහි ප්‍රසිද්ධ කරනු ලැබූ 1958 අංක 10 දරන සමගි මණ්ඩල පනතෙහි 3(2) වන වගන්තිය යටතෙහි වූ දැන්වීමේ උපලේඛනයෙහි අංක 3 දරණ ස්ථානයෙහි විස්තර කරනු ලැබූ සොරණාතොට ගම් ප්‍රදේශය සඳහා පිහිටුවනු ලැබූ සමගිදායකයින්ගේ සභාවේ සාමාජිකයන් වශයෙන් පහත සඳහන් තැනැත්තන් මෙයින් පත් කරමි :—

(1) කන්දෙගෙදර, පුස්සල්ලාකන්ද විහාරස්ථාන වාසී පූජ්‍ය කොහානේ උපසේන ස්ථවිරයන් වහන්සේ,

(2) කොහොවිල, බෝධිරුක්ඛාරාමය වාසී පූජ්‍ය ඇස්. පඤ්ඤාසාර ස්ථවිරයන් වහන්සේ,

(3) සොරණාතොට, කිතුල්වත්ත, "ගුරු මැඳුර" හි පදිංචි චන්ද්‍රසිරි කිතුල්වත්ත මහතා,

(4) කන්දෙගෙදර, කොහාන, ලියදිපිටිය පදිංචි පරාක්‍රම වාසල සෙනවිරත්න මුදියන්සෙලාගේ කිරි බණ්ඩා සමරකෝන් මහතා,

(5) කන්දෙගෙදර, ඇල්වත්ත, මූකලන්කොටුව පදිංචි මුතුවා පීරිස් කරුණාරත්න මහතා,

(6) සොරණාතොට, කුඹුගල, "ප්‍රේමසිරි නිවාස" හි පදිංචි රත්නායක මුදියන්සේලාගේ කිරිවින්තේ මහතා,

(7) සොරණාතොට, කිතුල්වත්ත, "ජය නිවස" හි පදිංචි විජේසේකර මුදියන්සේලාගේ ජයසුන්දර බණ්ඩා මහතා,

(8) කන්දෙගෙදර, ඇල්වත්ත, රටදොඩම්ගස්වත්ත පදිංචි වීරකුට්ටිදේවයලාගේ බින්දුවා මහතා,

(9) කිතුල්වත්ත, කොලොන්ගහවත්ත පදිංචි මැතික්සිරිහාමි මුදියන්සේලාගේ පිකිරි බණ්ඩා මහතා,

(10) කන්දෙගෙදර, ලියදිපිටිය, කොහාන, දෙහිලන්ද පදිංචි ලියදිපිටියෙ රත්නායක මුදියන්සේලාගේ ලොකු බණ්ඩා මහතා,

(11) කන්දෙගෙදර, පුස්සැල්ලාකන්ද, "ධම්මිකා සෙවන" හි පදිංචි රත්නායක මුදියන්සේලාගේ උක්කු බණ්ඩා මහතා,

(12) කන්දෙගෙදර, ඉඩමෙගම පදිංචි විජේරත්න ගනිතය ලාගේ පුංචිකිරා මහතා,

(13) කන්දෙගෙදර, දෙනිගස් තැන්න, පදිංචි රත්නායක මුදියන්සේලාගේ හීන් බණ්ඩා මහතා,

(14) කන්දෙගෙදර, පල්ලෙකැටිය, පල්ලෙවෙලගෙදර පදිංචි රත්නායක මුදියන්සේලාගේ ගුණසේකර මහතා,

(15) මුත්තෙට්ටුවගම, හේනායායේවත්ත පදිංචි රත්නායක මුදියන්සේලාගේ ඩිංගිරි බණ්ඩා මහතා,

(16) කන්දෙගෙදර, ගාල්පට්ටිය පදිංචි රත්නායක මුදියන්සේලාගේ හීන් බණ්ඩා මහතා,

(17) කන්දෙගෙදර, ඉඩමේගම, කහටගහඅරාව පදිංචි විජේරත්න ගනිතයලාගේ නිදුනා මහතා,

(18) කන්දෙගෙදර, කුරිඇල්ල, කොටුවත්ත පදිංචි කොටුවත්තේ උක්කු බණ්ඩා මහතා,

(19) සොරණාතොට, වෙලන්ගහල්ල පදිංචි ඒකනායක ජයසුන්දර මුදියන්සේලාගේ කිරි බණ්ඩා මහතා,

(20) සොරණාතොට, මීගහවෙල, යටිලැලේගෙදර පදිංචි රත්නායක මුදියන්සේලාගේ කිරිවන්තේ මහතා,

(21) බදුල්ල, තිඹිරිගස්පිටිය පදිංචි රත්නායක මුදියන්සේලාගේ විජේවර්ධන මහතා,

(22) සොරණාතොට, කොහොවිල, ජයසේගෙදර පදිංචි ජයසේකර ජයසුන්දර මුදියන්සේලාගේ අබේරත්න බණ්ඩාර මහතා,

(23) සොරණාතොට, මොරකොටුව, ගල්කන්ද පදිංචි රත්නායක මුදියන්සේලාගේ පොඩිඅප්පුහාමි මහතා,

(24) කන්දෙගෙදර, කොහොවිල, "ගුණසිරි නිවස" හි පදිංචි රාජපක්ෂ මුදියන්සේලාගේ කිරි බණ්ඩා මහතා,

(25) කන්දෙගෙදර, කොහොවිල, පිටහවත්ත පදිංචි රත්නායක මුදියන්සේලාගේ ගංඇති මහතා,

(26) සොරණාතොට, කොහොවිල, අගුරුමැලේගෙදර පදිංචි හෙන්නායක මුදියන්සේලාගේ අබේරත්න මහතා,

(27) සොරණාතොට, කොහොවිල, නයින්අරාව පදිංචි රත්නායක මුදියන්සේලාගේ කරුණාදාස මහතා,

(28) කන්දෙගෙදර, කොහොවිලකඳුර, "ඇලේගෙදර" හි පදිංචි අත්තනායක මුදියන්සේලාගේ පියසේන මහතා,

(29) සොරණාතොට, කොහොවිල, " අභය " හි පදිංචි ඉලුක් ඇල්ලේ ගෙදර අබේරත්න මහතා,

(30) බදුල්ල, පිදීපාන පදිංචි හේවයලාගේ වීරසිංහගේ ඇල්පේනිස් සිංඤෝ මහතා,

(31) සොරණාතොට, කොහොවිල, කිරිමැටියගෙදර පදිංචි සමරකෝන් මුදියන්සේලාගේ පුංචි බණ්ඩා මහතා,

(32) බදුල්ල, තිඹිරිගස්පිටිය පදිංචි ප්‍රේමවර්ධන මුනින්දාස දිසානායක මහතා,

(ආ) සොරණාතොට, කිතුල්වත්ත, " ගුරු මැදුර " හි පදිංචි චන්ද්‍රසිරි කිතුල්වත්ත මහතා, ඉහත කී සභාවෙහි සභාපති වශයෙන් මෙයින් පත් කරමි.

(ඇ) ඉහත කී සභාවේ සාමාජිකයෙකු වශයෙන් ඒ එක් එක් තැනැත්තකු පත් කරනු ලබන කාලය මේ ආඥාව ගැසට් පත්‍රයෙහි ප්‍රසිද්ධ කරනු ලබන දිනයේ සිට අවුරුදු 3 ක් විය යුතු බව ද මෙයින් නිශ්චය කරමි.

(ඈ) අංක 14,791 හා 1968. 1. 3 දින දරණ ගැසට් පත්‍රයේ පළවූ නිවේදනය අනුව මෙම ප්‍රදේශයට පත් කරන ලද සමඟි දායකයින්ගේ සභාව, මෙම නිවේදනය ගැසට් පත්‍රයෙහි පළවුන දින සිට අවලංගු වේ.

රත්නසිරි වික්‍රමනායක,
අධිකරණ ඇමතිවරයාගේ පාර්ලිමේන්තු ලේකම්.

1970 සැම්බර් මස 22 වැනි දින,
කොළඹ, අධිකරණ අමාත්‍යාංශයේ දී ය.

12-1224/3

---

## නොතාරිස් ආඥාපනත (107 වන අධිකාරය)

මාතර අධිකරණ කොට්ඨාශය ඇතුළත ඉංග්‍රීසි භාෂාවෙන් නොතාරිස් ධුරයේ කටයුතු කිරීමට බලය ලත් එලියස් සොලමන් පොන්සේකා මහතා විසින් නොතාරිස්වරුන් පිළිබඳ (පරිච්ඡේද අංක 107 දරණ) ආඥාපනතේ 22 (1) දරණ වගන්තිය යටතේ 1970 ක්වූ නොවැම්බර් මස 15 වැනි දින සිට නොතාරිස් ධුරයෙන් ඉල්ලා අස්වීමේ ලියකියවිලි ඉදිරිපත් කරන ලදුව, රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ කටයුතු පිළිබඳ ගරු ඇමතිතුමා විසින් එකී දින සිට, එම ඉල්ලා අස්වීම භාරගෙන තිබේ.

පී. සිරිවර්ධන,
රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා
ස්වදේශ කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ
ස්ථිර ලේකම්.

1970 ක්වූ දෙසැම්බර් මස 10 වැනි දින,
කොළඹ දී ය.

12-1226

---

## 1954 අංක 37 දරණ ජාතික නිවාස පනත

### 49 ඡේදය යටතේ සහතිකය

නිවාස හා ගොඩනැගිලි ඇමති පීටර් ජෙරල්ඩ් බර්තොලමියුස් කෙනමන් වන මම, 1954 අංක 37 දරණ ජාතික නිවාස පනතේ 49 වන ඡේදය යටතේ මා වෙත පැවරී ඇති බලතල උඩ මෙහි පහත සඳහන් උපලේඛනයෙහි විස්තර කර ඇති ඉඩම එම පනතෙහි 2 වන ඡේදයෙහි අදහසට ඇතුළත් නිවාස අරමුණක් ක්‍රියාත්මක කිරීම සඳහා රජය මඟින් අත්කර ගත යුතු බව මෙයින් සහතික කරමි.

පී. ජී. බී. කෙනමන්,
නිවාස හා ගොඩනැගිලි ඇමති.

1970 දෙසැම්බර් 14 වන දින,
කොළඹ දී ය.
කො. ම. ගා.,'ඉ/77.

### උපලේඛනය

බස්නාහිර පළාතේ කොළඹ දිස්ත්‍රික්කයේ කොළඹ ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාශයේ කොම්පඤ්ඤවීදිය ග්‍රාමසේවක කොට්ඨාශයේ ස්ටුවට් වීදියේ පිහිටි වරිපනම් අංක 50 දරණ ඉඩමෙන් පහත සඳහන් පරිදි මායිම් ඇති පර්චස් 130 ක පමණ ඉඩම් කොටසක් —

උතුරට සහ නැගෙනහිරට : ස්ටුවට් වීදිය ;

දකුණට සහ නැගෙනහිරට : ඊ. බී. ක්‍රීසි සහ සමාගමට අයිති ඉඩම ;

දකුණට සහ බස්නාහිරට : දුම්රිය පාර ;

නැගෙනහිරට සහ බස්නාහිරට : වරිපනම් අංක 48 ස්ටුවට් වීදිය.

12-1063

අංකය : ඊ/අයි. 1062.

## ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනත

### 4 (1) වන වගන්තිය යටතේ නියෝගයයි

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස්වරයාගේ ප්‍රකාශනයේ නියමිත කර දක්වා ඇති කාරණය පිළිබඳව එක් පාර්ශ්වයක් වශයෙන් ලංකා වෙළඳ සේවක සංගමය, 22 1/1, ඉහළ චැතැම් වීදිය, කොළඹ 1, හා අනෙක් පාර්ශ්වය වශයෙන් මෝටර් ලෝන්ච්ස් ලිමිටඩ් (සිය කමැත්තෙන් ඇවර කිරීම යටතේ ඇති) කුමාර වීදිය, කොළඹ 1, සහ කොළඹ රජින වීදියෙහි අංක 59 දරන ස්ථානයේ (ඈවරකරුවන් වන) ඇම්. ටී. එල්. ප්‍රනාන්දු, ජේ. එස්. මේදර්, ආර්. ඒ. වීරසිංහ සහ ආර්. විජේසේකරන් යන මහත්වරු අතර කාර්මික ආරවුලක් පවතින හෙයින් ද,

කම්කරු ඇමති තැන්පත් මයිකල් පෝල් ද සොයිසා සිරිවර්ධන වන මම, 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ, ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරවුල් පනතේ 4 (1) වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරවුල බේරුම් කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා බේරුම්කරු වශයෙන්, දෙහිවල ඇලන් ඇවනිව් අංක 72 හි අර්ල් ද අල්විස් මහතාට මෙයින් යොමු කරනු ලැබේ.

එම්. පී. ද ඉසෙඩ්. සිරිවර්ධන,
කම්කරු ඇමති.

1970 දෙසැම්බර් මස 19 දින,
කොළඹ දී ය.

## ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) 131 වන අධිකාරිය—කාර්මික ආරාවුල් පනත

එක් පාර්ශ්වයක් වශයෙන් ලංකා වෙළඳ සේවක සංගමය,
22 1/1, ඉහළ චැතැම් වීදිය, කොළඹ 1,
සහ
අනෙක් පාර්ශ්වය වශයෙන් මෝටර් ලෝන්චස් ලිමිටඩ් (සිය කැමැත්තෙන් ඈවර කිරීම යටතේ ඇති) කුමාර වීදිය, කොළඹ 1 සහ කොළඹ රජින වීදියෙහි අංක 59 දරණ ස්ථානයේ (ඈවරකරුවන් වන) ඇම්. ටී. එල්. ප්‍රනාන්දු, ජේ. එස්. මේදර්, ආර්. ඒ වීරසිංහ සහ ආර්. විජේසේකරන් යන මහත්වරු

අතර පවතින කාර්මික ආරවුලක් පිළිබඳවයි.

### ආරවුලට හේතුවී පවත්නා කාරණය පිළිබඳ ප්‍රකාශය

(සිය කැමැත්තෙන් ඈවර කිරීම යටතේ ඇති) මෝටර් ලෝන්චස් ලිමිටඩ්හි ව්‍යාපාර කටයුතු වසා දැමීම නිසා, ඉහත සඳහන් වෘත්තිය සමිතියේ සාමාජිකයන් වන පහත දැක්වෙන සේවකයන්, පාරිතෝෂික දීමනා සහ/හෝ වන්දි ගෙවන ලෙස ඉල්ලීම යුක්ති සහගත ද, එසේ නම්, කුමන පාරිතෝෂික දීමනා සහ/හෝ වන්දි ප්‍රමාණයක් ඔවුන් එකිනෙකාට ගෙවිය යුතුද යන්නත් පිළිබඳව වේ :—

1. ආර්. රත්නායක
2. ඊ. කේ. ආර්. ජොබ්ස්
3. සී. ද සිල්වා
4. එල්. ඩබ්ලිව්. මානිස් අප්පු
5. ජේ. එස්. පීච්චෙ
6. එල්. එම්. ඩේවිඩ්
7. එච්. ඊ. මුනිදාස
8. එච්. එච්. සිරිසේන
9. එච්. ඩී. මාර්ෂල්
10. එල්. ලූකස් ලෝපස්
11. ඩබ්. fප්‍රැන්සිස් අප්පු
12. ඒ. වින්සන්ට්
13. එම්. මාටිමුත්තු
14. එම්. ජෝර්ජ් පින්තු
15. එස්. සුන්දරම්
16. ඒ. මරියදාසන්
17. ඊ. ජෝශප් සිල්වා
18. ඒ. සෝමාල පීච්චි
19. පී. ජේම්ස් ඩයස්
20. ජේ. මැනුවෙල්
21. වයි. ජෝනන් සිංඤෝ
22. එස්. සුප්පයියා

1970 දෙසැම්බර් මස 16 වැනිදා වූ මෙදින කොළඹ, කම්කරු කොමසාරිස්ගේ කාර්යාලයේදී දින යොදන ලදී.

ඩබ්ලිව්. එල්. පී. ද මැල්,
කම්කරු කොමසාරිස්.

12-1096

අංකය : සී/අයි. 1013

## ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනත

### 4 (1) වන වගන්තිය යටතේ නියෝගයයි

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස්වරයාගේ ප්‍රකාශනයේ නියමිත කර දක්වා ඇති කාරණය පිළිබඳව එක් පාර්ශවයක් වශයෙන්, ලංකා වෙළඳ සේවක සංගමය, 22 1/1, ඉහළ චැතැම් වීදිය, කොළඹ 1, හා අනෙක් පාර්ශවය වශයෙන්, පෙරේසිරා ඇන්ඩ් ඩෙකර් ලිමිටඩ් (ඇවරකරු යටතේ ඇති), තැ. පෙ. 691, 75—යෝර්ක් වීදිය, කොළඹ 1 සහ කේ. සච්චිතානන්ද මහතා (පෙරේසිරා ඇන්ඩ් ඩෙකර් ලිමිටඩ්), නිලලත් භාරගන්නා හා තාවකාලික ඈවර කරු, තැ. පෙ. 918, 3 වන මහල, කාර්ගිල්ස් ගොඩනැගිල්ල, කොළඹ 1, අතර කාර්මික ආරවුලක් පවතින හෙයින් ද,

කම්කරු ඇමති තැන්පත් මයිකල් පෝල් ද සොයිසා සිරිවර්ධන වන මම, 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරණ කාර්මික ආරවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරවුල බේරුම් කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා කම්කරු විනිශ්චය සභා අංක XV වෙත මෙයින් යොමු කරනු ලැබේ.

එම්. පී. ද ඉසෙඩ් සිරිවර්ධන,
කම්කරු ඇමති.

1970 දෙසැම්බර් මස 18 දින,
කොළඹ දීය.

## ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල (1956 ප්‍රතිශෝධිත (මුද්‍රණය) 131 වන අධිකාරිය—කාර්මික ආරවුල් පනත

එක් පාර්ශවයක් වශයෙන් ලංකා වෙළඳ සේවක සංගමය, 22 1/1, කොළඹ 1, සහ

අනෙක් පාර්ශවය වශයෙන් පෙරේසිරා ඇනැඩ් ඩෙකර් ලිමිටඩ් (ඈවරකරු යටතේ ඇති) තැ. පෙ. 691, 75-යෝර්ක් වීදිය, කොළඹ 1 සහ කේ. සච්චිතානන්ද මහතා (පෙරේසිරා ඇන්ඩ් ඩෙකර් ලිමිටඩ්) නිලලත් භාරගන්නා හා තාවකාලික ඈවරකරු, තැ. පෙ. 918, 3 වන මහල, කාර්ගිල්ස් ගොඩනැගිල්ල, කොළඹ

අතර පවතින කාර්මික ආරවුලක් පිළිබඳවයි.

### ආරවුලට හේතුවී පවත්නා කාරණය පිළිබඳ ප්‍රකාශය

ඉහත සඳහන් පාර්ශ්වයන් අතර ආරවුලට හේතුවී ඇති කරුණ නම් :

පෙරේසිරා ඇන්ඩ් ඩෙකර් ලිමිටඩ්හි (ඈවරකරු යටතේ ඇති) ව්‍යාපාර කටයුතු වසා දැමීම නිසා ඉහත සඳහන් වෘත්තීය සමිතියේ සාමාජිකයන් වන පහත දැක්වෙන සේවකයන් පාරිතෝෂික දීමනා සහ/හෝ ඉල්ලා සිටීම යුක්ති සහගතද යන්නත්, එසේ නම්, ඔවුන් එකිනෙකාට කුමන පාරිතෝෂික දීමනා ප්‍රමාණයක් සහ/හෝ වන්දි ප්‍රමාණයක් ගෙවිය යුතුද යන්නත් පිළිබඳව වේ :—

1. එම්. අයි. එම්. කේ. රෝදර්,
2. කේ. ඩී. සී. පී. බස්නායක,
3. එස්. පරමනාදන්,
4. කේ. බී. පෙරේරා මෙනවිය,
5. පී. අරුල් ප්‍රගාසම්,
6. ඉන්ද්‍රා රෝදර් මහත්මිය,
7. ජී. බී. නූර්ජාන් මෙනවිය,
8. එස්. එම්. fපාරුක්,
9. එම්. එම්. රfපසිඩීන්,
10. ඒfස්. එජ්. ජී. මොහිඩීන්,
11. වී. එන්. සාහිඩ්,
12. කේ. අයි. ජිනදාස,
13. වී. ආර්. ඩෙයින්,
14. වී. ෂන්මුගරාජා,
15. ඩබ්. එජ්. වයි. ජයසේන,
16. ජී. පී. ඩී. ද සිල්වා.

1970 දෙසැම්බර් මස 10 වැනිදා වූ මෙදින කොළඹ, කම්කරු කොමසාරිස්ගේ කාර්යාලයේදී දින යොදන ලදී.

ඩබ්ලිව්. එල්. පී. ද මැල්,
කම්කරු කොමසාරිස්.

12-1073

අංකය : ටී 23/කො. 523/70.

## ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරවුල් පනත

### 4 (1) වන වගන්තිය යටතේ නියෝගයයි

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස් වරයාගේ ප්‍රකාශනයේ නියමිත කර දක්වා ඇති කාරණය පිළිබඳව කොළඹ 13, කොටහේන, අල්විස් පෙදෙසේ, අංක 102 හි, එස්. සී. පෙරේරා මෙනවිය හා කොළඹ 13. ස්කිනර්ස් පාර, උතුර, අංක 108 හි, සීමාසහිත සිලෝන් ටුබැකෝ සමාගම අතර කාර්මික ආරවුලක් පවතින හෙයින් ද,

කම්කරු ඇමති තැන්පත් මයිකල් පෝල් ද සොයිසා සිරිවර්ධන වන මම, 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරණ කාර්මික ආරවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ, ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරවුල් පනතේ 4(1) වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව එකී ආරවුල බේරුම් කිරීමෙන් සමථය කට පත් කිරීම සඳහා බේරුම්කරු වශයෙන්, කොළඹ, හල්ස්ඩෝප්, බෙල්මන්ට් වීදියේ අංක 5 හි, ආර්. කනගසුන්දරම් මහතා වෙත මෙයින් යොමු කරනු ලැබේ.

එම්. පී. ද ඉසෙඩ්. සිරිවර්ධන,
කම්කරු ඇමති.

1970 දෙසැම්බර් මස 21 වන දින,
කොළඹ දීය.

## ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) 131 වන අධිකාරිය—කාර්මික ආරවුල් පනත

කොළඹ 13, කොටහේනේ, අල්විස් පෙදෙසේ
අංක 102 හි, එස්. සී. පෙරේරා මෙනවිය

සහ

කොළඹ 13, ස්කිනර් පාර, උතුර, අංක 108 හි
සීමාසහිත සිලෝන් ටුබැකෝ සමාගම

අතර පවතින කාර්මික ආරවුලක් පිළිබඳවයි.

### ආරවුලට හේතුවී පවත්නා කාරණය පිළිබඳ ප්‍රකාශය

ඉහත සඳහන් පාර්ශ්වයන් අතර ආරවුලට හේතුවී පවත්නා කාරුණු නම් :

(i) සීමාසහිත සිලෝන් ටුබැකෝ සමාගමේ පාලක පක්ෂය විසින් එස්. සී. පෙරේරා මෙනවිය 1970 මැයි මස 14 වෙනි දින සිට අනිවාර්යයෙන් නිවාඩු ගැන්වීම යුක්ති සහගතද, ඇයට කුමන සහනයක් හිමිවිය යුතුද යන්නත්,

(ii) සීමාසහිත සිලෝන් ටුබැකෝ සමාගමේ පාලක පක්ෂය විසින් 1970 නොවැම්බර් මස 22 වෙනි දින එස්. සී. පෙරේරා මෙනවිය සේවයෙන් පහකිරීමේ නිවේදනය නිකුත් කිරීම යුක්ති සහගතද, ඇයට කුමන සහනයක් හිමිවිය යුතුද යන්නත් පිළිබඳව වේ.

1970 දෙසැම්බර් මස 11 වැනිදා වූ මෙදින කොළඹ, කම්කරු කොමසාරිස් කාර්යාලයේ දී දින යොදන ලදී.

ඩබ්ලිව්. එල්. පී. ද මැල්,
කම්කරු කොමසාරිස්.

12-1106

---

අංකය : ටී. 23/කො. 1096/70.

## ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරවුල් පනත

### 4 (1) වන වගන්තිය යටතේ නියෝගයයි

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස් වරයාගේ ප්‍රකාශනයේ නියමිත කර දක්වා ඇති කාරණය පිළිබඳව එක් පාර්ශ්වයක් වශයෙන් රජගිරිය, නාවල යර්නිඳුලූජ් පාරේ, අංක 24හි ඇf්. හෙන්ඩ්‍රික්ස් සහ ඇම්. ඒ. ප්‍රේමදාස යන මහත්වරුන් සහ අනික් පාර්ශ්වය වශයෙන් මෝටර් ලෝරිවස් ලිමිටඩ් (සිය කැමැත්තෙන් ඈවර කිරීම යටතේ ඇති), කුමාර වීදිය, කොළඹ 1, සහ කොළඹ, රජින වීදියෙහි, අංක 59 දරන ස්ථානයේ (ඈවරකරු

වන්වන) ඇම්. ටී. එල්. ප්‍රනාන්දු, ජේ. එස්. මේදර්, ආර්. ඒ. වීරසිංහ සහ ආර්. විජේසේකරන් යන මහත්වරු අතර කාර්මික ආරවුලක් පවතින හෙයින්ද,

කම්කරු ඇමති පැන්පත් මයිකල් පෝල් ද සොයිසා සිරිවර්ධන වන මම, 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ, ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරවුල් පනතේ 4 (1) වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරවුල බේරුම් කිරීමෙන් සමථයකට පත්කිරීම සඳහා බේරුම්කරු වශයෙන්, දෙහිවල ඇලන් ඇවනිව් අංක 72 හි අර්ල් ද අල්විස් මහතාට මෙයින් යොමුකරනු ලැබේ.

එම්. පී. ද ඉසෙඩ්. සිරිවර්ධන,
කම්කරු ඇමති.

1970 දෙසැම්බර් මස 22 දින,
කොළඹදීය.

## ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) 131 වන අධිකාරිය—කාර්මික ආරවුල් පනත

එක් පාර්ශ්වයක් වශයෙන් රාජගිරිය, නාවල, සර්කියුලර් පාරේ අංක 24 හි, ඇෆ්. හෙන්ඩ්‍රික්ස් සහ ඇම්. ඒ. ප්‍රේමදාස යන මහත්වරුන්

සහ

අනික් පාර්ශ්වය වශයෙන් මෝටර් ලෝන්වස් ලිමිටඩ් (සිය කැමැත්තෙන් ඈවරකිරීම යටතේ ඇති) කුමාර වීදිය, කොළඹ 1, සහ කොළඹ, රජන වීදියෙහි, අංක 59 දරන ස්ථානයේ (ඈවර කරුවන් වන) ඇම්. ටී. එල්. ප්‍රනාන්දු, ජේ. එස්. මේදර්, ආර්. ඒ. වීරසිංහ සහ ආර්. විජේසේකරන් යන මහත්වරු

අතර පවතින කාර්මික ආරවුලක් පිළිබඳවයි.

**ආරවුලට හේතුවී පවත්නා කාරණය පිළිබඳ ප්‍රකාශය**

ඉහත සඳහන් පාර්ශ්වයන් අතර ආරවුලට හේතුවී ඇති කරුණ නම් :

(සිය කැමැත්තෙන් ඈවරකිරීම යටතේ ඇති) මෝටර් ලෝන්වස් ලිමිටඩ්හි ව්‍යාපාර කටයුතු වසා දැමීම නිසා, ඇෆ්. හෙන්ඩ්‍රික්ස් සහ ඇම්. ඒ. ප්‍රේමදාස යන මහත්වරුන්ට පාරිතෝෂික දීමනා සහ /හෝ වන්දි ගෙවන ලෙස ඉල්ලීම යුක්ති සහගතද, එසේ නම්, කුමන පාරිතෝෂික දීමනා සහ/හෝ වන්දි ප්‍රමාණයක් ඔවුන් එකිනෙකාට ගෙවිය යුතුද යන්නත් පිළිබඳව වේ.

1970 දෙසැම්බර් මස 21 වැනිදා වූ මෙදින, කොළඹ, කම්කරු කොමසාරිස්ගේ කාර්යාලයේදී දින යොදන ලදී.

ඩබ්ලිව්. එල්. පී. ද මැල්,
කම්කරු කොමසාරිස්.

12-1133

---

# විවිධ දෙපාර්තමේන්තු දැන්වීම්

## ශත 25 වශීයේ මුද්දර නිකුත් කිරීම—අලෙවිය සඳහා යළි නිකුත් කිරීම

සීගිරි බිතු සිතුවම් පිළිබිඹු කෙරෙන ශත 25 වශීයේ තැපැල් හා ආදායම් මුද්දර 1971 ජනවාරි 1 දින සිට අලෙවිය සඳහා යළි නිකුත් කරන බව මහජනයා වෙත මෙයින් දැනුම් දෙනු ලැබේ.

ස. සිට්ටම්පලම්,
දේශීය ආදායම් කොමසාරිස්.

දේශීය ආදායම් දෙපාර්තමේන්තුව,
කොළඹ 1, 1970 දෙසැම්බර් 21 දින.

12-1135

---

ණය අංක 2155.

## ලංකාවේ කෘෂිකර්ම සහ කර්මාන්ත ණය සංස්ථාව

**402 වන අධිකාරය වන කෘෂිකර්ම සහ කර්මාන්ත ණය සංස්ථාව පිළිබඳ ආඥාපනතේ 71 වන වගන්තිය යටතේ යෝජනාව**

1970 සැප්තැම්බර් 13 වෙනි දින ලංකාවේ කෘෂිකර්ම සහ කර්මාන්ත ණය සංස්ථාවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පහත සඳහන් යෝජනාව ඒකමතිකව සම්මත කොටගත් බව මෙයින් නිවේදනය කරනු ලැබේ :—

" ප්‍රසිද්ධ නොතාරිස් පැන්පත් ඇෆ්. වී. එච්. ලැබ්රෝයි විසින් ලංකාවේ කෘෂිකර්ම සහ කර්මාන්ත ණය සංස්ථාට පක්ෂව ලියා සහතික කරන ලද අංක 875 සහ 60.3.22 දින දරන බැඳුම්කරයෙහි සඳහන් ගෙවීම් මහනුවර දිස්ත්‍රික්කයේ, හැටන්හි පදිංචි සින්නයියා සෙල්ලතුරෙයි සහ කුන්රත්නඅම්මාල් සෙල්ලතුරෙයි (ස්වාමි පුරුෂයා සහ භාර්යාව) නමැති අයවලුන් විසින් පැහැර හැර ඇති හෙයින්ද, එකී අංක 875 දරන බැඳුම්කරය යටතේ රුපියල් හැටඅට දාස් තුන්සිය අසූතුනයි ශත අසූදෙකක (රු. 68,383/82) මුදලක් එකී සංස්ථාවට දැනට අයවිය යුතු හෙයින්ද, එකී රු. 68,383/82 ක මුදල ආඥාපනතේ 78 වන වගන්තියේ විධිවිධාන යටතේ මුල් මුදලේ ශේෂය වන රු. 58,316/51ට අවුරුද්දට සියයට 5 1/2 බැගින් 70.6.11 දින සිට මෙම විකුණුම් දිනය දක්වා වූ කාලය වෙනුවෙන් අය විය යුතු වැඩිපුර පොලියත්, ප්‍රසිද්ධ කිරීමේ ගාස්තු සහ විකිණීම් සහ අවශේෂ වියදම් ද අයකර ගැනීම සඳහා එකී ප්‍රසිද්ධ නොතාරිස් වන ඇෆ්. වී. එච්. ලැබ්රෝයි විසින් සහතික කරන ලද අංක 875 සහ 60.3.22 දින දරන එකී බැඳුම්කරය යටතේ එකී සංස්ථාවට උකස් කරනු ලද්දාවූත්, පහත සඳහන් ඉඩම් කැබලි වලින් සමන්විත වන්නාවූ, පර්න්ඩේල් වත්ත නමැති දේපල සහ එහි පිහිටි තේ කර්මාන්තශාලාව, බංගලා කම්කරු නිවාස සහ අනිකුත් සවිකර ඇති දේද :—

(1) (අ) මැද පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, උඩසිය පත්තුවේ, රංගල පිහිටි (පටුමග, පාර සහ දෙපැත්තෙන්ම ලින්ක් 100ක් පළල්වූ වෙන්කරන ලද ඉඩම් කොටසද අත්හැර) අංක 111584 ප්‍රකාර අ. 310, රූ. 0, ප. 0 ක ප්‍රමාණයෙන් යුත්—ඇෆ්. 160/80හි ලියාපදිංචිවී ඇති ඉඩම,

(ආ) එහි රංගල පිහිටි (දිය පාරක් සඳහා වෙන්කරන ලද) අංක 1,57,697 දරන මුල් ඔප්පු ප්ලෑනය ප්‍රකාර (ඉඩම මැදින් වැටී ඇති පාරවල් සහ දියපාරවල් අත්හැර) අ. 31, රූ. 2, ප. 20 ක ප්‍රමාණයෙන් යුත් ඇෆ්. 160/81 හි ලියාපදිංචිවී ඇති ඉඩම,

(2) ඉහත කී වඩුවෙල්කන්දේ පිහිටි කොබෝනීල වත්තේ කොටසක් වන අ. 8, රූ. 1, ප. 1.8 ක ප්‍රමාණයෙන් යුත් මහනුවර ඉඩම් කාර්යාලයේ ඒ 149/40 හි ලියාපදිංචිවී ඇති ඉඩම

යන නම්වලින් හඳුන්වනු ලබන්නාවූ දේපළ සහ ඉඩම් මහනුවර බලයලත් වෙන්දේසිකාර ලොයිඩ් සමරවික්‍රම විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු බවට (ලංකා නීති ප්‍රඥප්ති සංග්‍රහයේ 1956 ප්‍රතිශෝධිත මුද්‍රණයේ 402 වැනි අධිකාරය වන), ලංකාවේ කෘෂිකර්ම සහ කර්මාන්ත ණය සංස්ථාව පිළිබඳ ආඥාපනතින් තමන් වෙත පැවරී ඇති බලතල යටතේ ලංකාවේ කෘෂිකර්ම සහ කර්මාන්ත ණය සංස්ථාවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙයින් තීරණය කරනු ලැබේ."

හි. සැ. පො. ගුණවර්ධන,
සාමාන්‍යාධිකාරී.

1970 දෙසැම්බර් 10 වෙනි දින,
කොළඹ 3, ගාලු පාරේ අංක 292 දරණ ස්ථානයේදීය.

12-1142

---

ණය අංක 1396/2999.

## ලංකාවේ කෘෂිකර්ම සහ කර්මාන්ත ණය සංස්ථාව

**402 වන අධිකාරය වන කෘෂිකර්ම සහ කර්මාන්ත ණය සංස්ථාව පිළිබඳ ආඥාපනතේ 74 වන වගන්තිය යටතේ විකුණුම් දැන්වීමයි**

ලංකාවේ කෘෂිකර්ම සහ කර්මාන්ත ණය සංස්ථාවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් (1956 ලංකා නීති ප්‍රඥප්තියේ ප්‍රතිශෝධිත සංස්කරණයේ 402 වැනි අධිකාරය වූ) ලංකාවේ කෘෂිකර්ම සහ කර්මාන්ත ණය සංස්ථා ආඥාපනතේ 71 වන වගන්තිය යටතේ සම්මත කරන ලදුව අංක 14,907 හා 1970 මැ 3 22 වැනි දින දරණ ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයෙහිද 1970 ජූනි 22 වැනි දින 'සිලෝන් ඩේලි නිව්ස්' පත්‍රයෙහිද පළවූ තීරණය අනුව, පූර්වෝක්ත ආඥා පනතේ 78 වැනි වගන්තිය ප්‍රකාර, විකුණන අවස්ථාවේදී අයවීමට තිබෙන මුළු මුදලේ ශේෂය, පොලිය, විකුණුම් වියදම් සහ අවශේෂ ගාස්තුද වශයෙන් අයකර ගැනීමට ඇති වියදම් මුදල් අයකර ගැනීම පිණිස, ලංකාද්වීපයේ, මධ්‍යම පළාතේ, මාතලේ දිස්ත්‍රික්කයේ, උතුරු මාතලේ, උඩසිය පත්තුවේ, උඩුගොඩ, දිඹුල්ගොමුවේ පිහිටි මාතලේ බලයලත් මිනින්දෝරු බී. ඇය්. ඒ. කෘෂන් විසින් සකස්කරන ලද අංක 225 සහ 1943 සැප්තැම්බර් දින දරණ ප්ලෑනේ ලොට් 8 වශයෙන් දක්වා තිබෙන්නාවූද, එකී මිනින්දෝරු තැන විසින් සකස්කරන ලද අංක 1267 සහ 1951 පෙබරවාරි දින දරන ප්ලෑනේ වෙන් වශයෙන් දක්වා තිබෙන්නාවූද, සත්දර

බී1. 90/12517 යනුවෙන් ලියාපදිංචි කර ඇති, තල්ගහවත්ත දවට ගහවත්ත, දිවුලගහවත්ත, තෙල්ලිගහවත්ත නමැති ඉඩම සහ කුඹුරෙන් මැන බෙදා වෙන් කරන ලද බී දරණ කැබැල්ල සහ එහි පිහිටි සියළුම ගොඩනැගිලි සහ වැව්ලිද වෙයි.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ජී. එච්. ඊ. ද සිල්වා,
ප්‍රධාන අයකිරීමේ නිලධාරී.

මධ්‍යම අයකිරීමේ දෙපාර්තමේන්තුව,
මහජන බැංකුව,
යෝ. ඉ. සං. නි. ගොඩනැගිල්ල,
බ්‍රිස්ටල් වීදිය,
කොළඹ 1. 1970. 12. 17.

12-1163

---

ඇල්.සී.—බී 60/34.

## රේගු නිවේදනය, අංක 5/70 දරන බැඳුම්කරය

### රේගු ආඥාපනත

(235 වැනි අධිකාරය වන) රේගු ආඥාපනතේ 69 වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, ප්‍රධාන රේගු අයකැමි, විජය පෙරේරා විට්ටාච්චි වන මම, ඒ වගන්තියෙන් තමා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර මුදල් ඇමතිවරයා විසින් දෙන ලද අනුමතිය ඇතිව, ඔහුගේ නියමිය පරිදි පළ කරනු ලබන මේ නිවේදනයෙන්, කොළඹ 2, කුමාරන් රත්නම් පාරේ අංක 98/11 දරන ස්ථානයේ පිහිටි (13′ 9″ × 9′ × 10″ × 7′ ප්‍රමාණයෙන් යුතු) ගබඩාව, ජේ. ඒ. සී. වික්ටෝරියා මහතුන් විසින් ආනයනය කරනු ලබන (මෝල්ට් මත් පැන් ඇතුළු) මත්පැන් ඒවායේ ප්‍රථම ආනයන බිල් සටහන වෙනුවෙන් තීරු ගාස්තු නොගෙවා ගබඩා කිරීම, තැබීම, හා ආරක්ෂාව සැලසීම කළ හැකි ගුදමක් වශයෙන් අනුමත කොට නියම කරමි.

ජී. පී. විට්ටාච්චි,
ප්‍රධාන රේගු අයකැමි.

1970 දෙසැම්බර් 11 වැනි දින,
කොළඹ දී ය.

12-1062

---

## කො/ශ්‍රී විද්‍යාලෝක පිරිවෙන—පහල බෝමිරිය, යාකාල—කඩුවෙල

කොළඹ දිස්ත්‍රික්කයේ හේවාගම් කෝරළයේ, කඩුවෙල-යාකාල, පහල බෝමිරියේ, අභිනවාරාම විහාරස්ථ ඉඩමෙහි පිහිටි ඉහත සඳහන් පිරිවෙන, රජයේ ආධාර ලබන කනිෂ්ඨ පිරිවෙනක් ලෙස ලියාපදිංචි කිරීමට, එහි කාර්‍යාධිකාරී පූජ්‍ය වි. අතුලවංස ස්ථවිරයන් වහන්සේගෙන් ඉල්ලීමක් ලැබී ඇත.

මේ දැන්වීම ප්‍රසිද්ධ කළ දිනයේ සිට තිස් (30) දවසක් ඇතුළත මේ ඉල්ලීමට විරුද්ධතාවයක් ඇත්නම්, ඒ බව මා වෙත දැනුම් දිය යුතුය.

දෙ. ග. සුගතදාස,
කොළඹ ප්‍රදේශයේ අධ්‍යාපන අධ්‍යක්ෂ.

කො/පාඅග/179 (හේමා),
1970 දෙසැම්බර් මස 23 දින,
කොළඹ 7, ග්‍රීන්පාත් හි,
ප්‍රාදේශීය අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ දීය.

12-1210

## ප්‍රකාශනය

අම්පාර දිස්ත්‍රික්කයේ වැවගම්පත්තු ප්‍රදේශයේ පිස්සු බල්ලු උවදුර පවතින නිසා මෙම දිස්ත්‍රික්කයේ ආණ්ඩුවේ ඒජන්ත රොබින් බැඩ්මන් වීරකෝන් වන මම පිස්සු බලු ආඥාපනතේ (476 වෙනි පරිච්ඡේදයේ XII වෙනි කාණ්ඩයේ) 11 වන වගන්තියේ (1) වන උප වගන්තිය යටතේ මෙම පෙදෙස පිස්සු බල්ලු උවදුරු පෙදෙස වශයෙන් ප්‍රකාශ කරමි.

ඉහත සඳහන්ව ඇති පෙදෙස් තුල පෞද්ගලික ගොඩනැගිල්ලක, ගෙමිදුලක හෝ ඉඩමක හැර, වෙනත් ප්‍රසිද්ධ ස්ථානයක දී පාරක් හෝ වෙනයම් ස්ථානයක දී පටියකින් බැඳගෙන හෝ කෙනෙකු විසින් ගෙනයනු නොලබන ඕනෑම බල්ලෙකු දුටු විගාම මරා දැමීමට පිස්සු බලු ආඥාපනතේ (476 වෙනි පරිච්ඡේදයේ XII වෙනි කාණ්ඩයේ) 11 වගන්තියේ (2) වන උප වගන්තිය යටතේ, ඉඩ තිබේ.

ආර්. බී. වීරකෝන්,
අම්පාර දිස්ත්‍රික්කයේ
ආණ්ඩුවේ ඒජන්ත.

කච්චේරිය,
අම්පාර.
1970. 12. 14

12-1068

---

මගේ අංකය : සීකේ/ආර්බී/14

## පිස්සු බලු උවදුර

කොළඹ දිස්ත්‍රික්කයේ ගම්බද ප්‍රදේශවල පිස්සු බලු උවදුර පවතින බව මට ඒත්තු ගොස් තිබෙන නිසා, එම දිස්ත්‍රික්කයේ කොළඹ, දෙහිවල-ගල්කිස්ස සහ මීගමුව සහ මහ නගර සභා සීමාවලින් ද, අවිස්සාවේල්ල, ගම්පහ, ජ.ඇල, කොලොන්නාව, කෝට්ටේ, මොරටුව, වත්තල, මාබෝලේ, සහ පෑලියගොඩ යන අලාත් ආණ්ඩු සභා සීමාවලින් ද, බත්තරමුල්ල, කොටිකාවත්ත, කැළණිය, හැඳල, කඳාන, මුල්ලේරියාව, මහරගම, හෝමාගම, දළුගම, පිළියන්දල, රාගම, මිරිගම, වේයන්ගොඩ, මිනුවන්ගොඩ හා කොච්චිකඩේ යන සුළු නගර සභා සීමාවලින් ද පිටත පිහිටි කොළඹ දිස්ත්‍රික්කයට අයත් සියළුම ප්‍රදේශ පිස්සු බලු උවදුර පවතින හෝ පැවතීමට ඉඩ ඇති ප්‍රදේශ ලෙස පිස්සු බලු ආඥාපනතේ (476 වැනි පරිච්ඡේදයේ) 11 වැනි වගන්තිය යටතේ 1971 ජනවාරි මස 1 වැනි දින සිට මෙයින් ප්‍රකාශයට පත් කරමි.

2. කොළඹ දිස්ත්‍රික්කයේ යථෝක්ත ප්‍රදේශය තුල පෞද්ගලික ගොඩනැගිල්ලක, ගෙමිදුලක හෝ ඉඩමක හැර ප්‍රසිද්ධ ස්ථානයකදී ගමුවන, පටියකින් බැඳ හෝ කෙනෙකු විසින් ගෙනයනු නොලබන ඕනෑම බල්ලකු දුටු විගාම මරා දැමීමට ඉඩ තිබේ.

ඩ. වී. ද අල්විස්,
කොළඹ දිස්ත්‍රික්කයේ දිසාපති.

1970 දෙසැම්බර් මස 23 දින,
කොළඹ දිසාපති කාර්‍යාලයේ දී ය.

12-1227

---

# "සුරාබදු ආඥාපනත" පිළිබඳ දැන්වීම්

මගේ අංකය : සුරා 19/70.

## 1970–71 වසරේ කොළඹ දිස්ත්‍රික්කයේ තැබෑරුම් වැසීමට ප්‍රාදේශීය ඡන්ද විමසීම

සුරාබදු නිවේදන අංක 180, 187, 194, 221, 225, 231, 401, 483 සහ 522 වලින් සංශෝධිත 1925 අගෝස්තු මස 14 වැනි දින හා අංක 7428 දරණ රජයේ ගැසට් පත්‍රයේ පළ කරන ලද අංක 146 දරණ සුරාබදු නිවේදනයේ 6 වැනි නීතිය ප්‍රකාර පහත උපලේඛනයේ සඳහන් රා තැබෑරුම් දෙක 1971 ඔක්තෝබර් මස 1 වැනි දින සිට වසා තැබීම සඳහා සංශෝධිත ඡන්ද ලැයිස්තුවේ නම් සඳහන් ඡන්දදායකයින්ගෙන් සියයට විසිපහකට නොඅඩු සංඛ්‍යාවක් ඡන්දය දෙන්නේ ද යන්න සහ එසේ නම් එම සංඛ්‍යාවෙන් වැඩි කොටසක් එම තැබෑරුම් දෙක වැසීමට කැමැත්ත ප්‍රකාශ කර ඡන්දය දෙන්නේද යන්න නිශ්චය කිරීමට ඡන්ද විමසීමක් පහත උපලේඛනයේ සඳහන් ස්ථාන, දින සහ වේලාවන් තුලදී පැවැත්වීමට නියම කරන ලද බැව් මෙයින් දැනුම් දෙමි.

## උපලේඛනය

| කැබැරුම් | දිනය | වේලාව | ඡන්දය දෙන ස්ථානය | ඡන්ද කොට්ඨාශයට අයත් ප්‍රදේශය |
|---|---|---|---|---|
| කොළඹ මහ නගර සභාවේ බටහිර කොටහේන ඡන්ද කොට්ඨාශයේ අංක 1 දරණ කෝටබෝම් සහ අංක 2 දරණ ස්කිනර්ස් පාර රා තැබැරුම් | 1971 ජනවාරි මස 25 වැනි දින | පෙ.ව. 8 සිට දවල් 12 දක්වා සහ ප.ව. 1 සිට 6 දක්වා | (1) කොටහේනේ කොටහේ හේන විදියේ කැතීඩ්‍රල් වි හල<br>ඡන්ද පොලට අනුයුක්ත ඡන්දදයක අංක 1–3006 දක්වා | (1) බටහිර කොටහේන ඡන්ද කොට්ඨාශයේ :—<br>කොලෙජ් ස්ට්‍රීට් (ඉරට්ට අංක 92 සිට 104 දක්වා),<br>ජිනානන්ද මාවත (ඔත්තේ අංක 17 සිට 49ඒ දක්වා),<br>කොටහේන වීදිය (ඔත්තේ අංක 5 සිට 159 දක්වා),<br>පිකරින්ස් පාර (ඔත්තේ අංක 97 සිට 203 දක්වා සහ ඔත්තේ සහ ඉරට්ට අංක 50/2 සිට 256 දක්වා),<br>ශ්‍රී ගුණානන්ද මාවත (සන්තියාගු වීදිය) (ඉරට්ට අංක 10 සිට 194/4 දක්වා සහ ඔත්තේ අංක 5 සිට 35 දක්වා),<br>11 වෙනි පටුමග (ඔත්තේ සහ ඉරට්ට අංක 6 සිට ට් 15 දක්වා),<br>12 වෙනි පටුමග (අංක 1),<br>13 වෙනි පටුමග (ඔත්තේ සහ ඉරට්ට අංක 7 සිට 16ඒ දක්වා),<br>14 වෙනි පටුමග (ඔත්තේ සහ ඉරට්ට අංක 3 සිට 27/4 දක්වා,<br>බොන්ජීන් පාර (ඔත්තේ සහ ඉරට්ට අංක 1 සිට 61 දක්වා,<br>එස්කිමුත්තු පෙදෙස (ඔත්තේ සහ ඉරට්ට අංක 9 සිට 39 දක්වා). |
| | | | (2) නාගරික ප්‍රජා මණ්ඩල මධ්‍යස්ථානය, රත්නම් පාර, නිව්න්හැම් චතුරශ්‍රය, කොච්චිකඩේ<br>ඡන්දපොලට අනුයුක්ත ඡන්දදයක අංක 3007–5453 දක්වා | (2) බටහිර කොටහේන ඡන්ද කොට්ඨාශයේ :—<br>ජෝර්ජ් ආර්. ද සිල්වා මාවත (උතුරු ස්කිනර්ස් පාර) ඔත්තේ සහ ඉරට්ට අංක 37 සිට 214 දක්වා,<br>ගල්පොත වීදිය ඔත්තේ අංක 5 සිට 77 දක්වා,<br>ජම්පටා වීදිය ඔත්තේ අංක 5 සිට 239 දක්වා,<br>ශ්‍රී බෝධිරාජ මාවත (ෂූ රෝඩ්) (ඔත්තේ සහ ඉරට්ට අංක 7 සිට 98 දක්වා),<br>ශ්‍රී සිවානන්ද මාවත (ලස්කාරින් වීදිය) ඔත්තේ සහ ඉරට්ට අංක 9 සිට 64 දක්වා<br>ශ්‍රීමත් රාමනාදන් මාවත (කෝටබෝම් වීදිය) ඉරට්ට අංක 6 සිට 154 දක්වා |

**සැලකිය යුතුයි.**—ඡන්ද ගණන් කිරීම සහ ප්‍රතිඵල නිකුත් කිරීම අංක 1 ඡන්ද පොල වන කැතීඩ්‍රල් විදුහලේ සිදු කෙරේ.

1970 දෙසැම්බර් මස 24 වන දින,
කොළඹ 1-, දිසාපති කාර්යාලයේ දිය.
12–1229

ඩ. වි. ද අල්විස්,
කොළඹ දිස්ත්‍රික්කයේ දිසාපති.

## ගැසට් පත්‍රය පළකිරීම පිළිබඳව වැදගත් නිවේදනයයි

සතිපතා මුද්‍රණය වන ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය සාමාන්‍යයෙන් සිකුරාද දිනවල පළ කරනු ලැබේ. සිකුරාද දිනයක් ආණ්ඩුවේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාද දිනයට ප්‍රථම වැඩ කරන දිනයේ ගැසට් පත්‍රය පළ කරනු ලැබේ. ඒ අනුව ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා නිවේදන බාරගන්නා අන්තිම දිනය ද එම සතියේ ඇතිවන ප්‍රසිද්ධ නිවාඩු දින ගණන අනුව වෙනස් වනු ඇත.

ඒ ඒ ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා දැන්වීම් භාරගන්නා අන්තිම දින සහ වේලාවන් පහත පළකර ඇති උපලේඛනයේ දැක්වේ. පහත සඳහන් නියමිත වේලාවන්ට පසුව ලැබෙන සියළුම දැන්වීම් එය එවූ අය වෙත තැපැලෙන් ආපසු එවනු ලැබේ. ඊළඟ ගැසට් පත්‍රයේ එය පළ කළ යුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු එවිය යුතුය. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මගින් එවන දැන්වීම් අප්‍රමාදව එහි ලැබීමට සෑහෙන වේලාවක් දී තැපැල් කිරීමෙන් උවමනා ගැසට් පත්‍රයට දැන්වීම් ඇතුළත් වනවාත් හැර එය සියළුදෙනාගේ පහසුවට ද හේතු වන බව සලකන්න.

ආණ්ඩුවේ ගැසට් පත්‍රය සඳහා ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති දයක මුදල් භාර නොගනී. සියළුම දයක මුදල් කොළඹ මහලේකම් කාර්යාල ගොඩනැගිල්ලේ පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත කෙළින්ම ගෙවිය යුතුය.

සැ. යු.—මුදල් ගෙවා ගැසට් පතෙහි පළ කරනු ලබන දැන්වීම් සඳහා අය විය යුතු මුදල් රජයේ ප්‍රකාශනාංශයේ අධිකාරි වෙත නොව රජයේ මුද්‍රණාලයාධිපති වෙත එවිය යුතු බව සලකන්න.

### උපලේඛනය

**1970**

| මාසය | පළකිරීමේ දිනය | ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය හා වේලාව | | |
|---|---|---|---|---|
| දෙසැම්බර් ... | 70.12. 4 සිකුරාද ... | 70.11.27 සිකුරාද | දහවල් | 12.00 |
| | 70.12.11 සිකුරාද ... | 70.12. 4 සිකුරාද | දහවල් | 12.00 |
| | 70.12.18 සිකුරාද ... | 70.12 10 බ්‍රහස්පතින්ද | ප. ව. | 3.30 |
| | 70 12.24 බ්‍රහස්පතින්ද ... | 70 12.17 බ්‍රහස්පතින්ද | ප. ව. | 3.30 |
| | 70.12.31 බ්‍රහස්පතින්ද ... | 70.12.24 බ්‍රහස්පතින්ද | ප. ව. | 3.30 |

**1971**

| | | | | |
|---|---|---|---|---|
| ජනවාරි ... | 71. 1. 8 සිකුරාද ... | 70.12.31 බ්‍රහස්පතින්ද | ප. ව. | 3.30 |
| | 71. 1.15 සිකුරාද ... | 71. 1. 8 සිකුරාද | ප. ව. | 3.30 |
| | 71. 1.22 සිකුරාද ... | 71. 1.15 සිකුරාද | ප. ව. | 3.30 |
| | 71. 1.29 සිකුරාද ... | 71. 1.22 සිකුරාද | ප. ව. | 3.30 |
| පෙබරවාරි ... | 71. 2. 5 සිකුරාද ... | 71. 1.29 සිකුරාද | ප. ව. | 3.30 |
| | 71. 2.12 සිකුරාද ... | 71. 2. 3 බදාද | ප. ව. | 3.30 |
| | 71. 2.19 සිකුරාද ... | 71. 2.12 සිකුරාද | ප. ව. | 3.30 |
| | 71. 2.26 සිකුරාද ... | 71. 2.19 සිකුරාද | ප. ව. | 3.30 |
| මාර්තු ... | 71. 3. 5 සිකුරාද ... | 71. 2.26 සිකුරාද | ප. ව. | 3.30 |
| | 71. 3.12 සිකුරාද ... | 71. 3. 3 බදාද | දහවල් | 12.00 |
| | 71. 3.19 සිකුරාද ... | 71. 3.10 බදාද | දහවල් | 12.00 |
| | 71. 3.26 සිකුරාද ... | 71. 3.17 බදාද | දහවල් | 12.00 |

එල්. ඩබ්ලිව්. පී. පීරිස්,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

1970 දෙසැම්බර් 18 වැනි දින,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව, කොළඹ.

ලංකාණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රපිතයි